# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயற்றிறன் அறிக்கை
# Annual Performance Report

# 2022

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**தேசிய திட்டமிடல் திணைக்களம்**

**நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு**

## Department of National Planning
## Ministry of Finance, Economic Stabilization and National Policies

# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය 237

**පිටු අංකය**


01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

1.1. හැඳින්වීම 3
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3. ප්‍රධාන කාර්යයන් 4
1.4. සංවිධාන සටහන 5
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල් 6
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7
2.1 සංචාරක,කර්මාන්ත සහ වෙළෙඳ 7
2.2 කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් , ධීවර, වැවිලි , පරිසර හා ආපදා කළමනාකරණය 10
2.3 මාර්ග, වරාය, ගුවන් සේවා , ප්‍රවාහන ,විදුලිබල හා බලශක්තිය, ජල හා සනීපාරක්ෂක සේවා 18
2.4 නාගරික සංවර්ධන සහ නිවාස 20
2.5 සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය 21
2.6 රාජ්‍ය කළමනාකරණය, යහපාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු හා සාර්ව ආර්ථික සංවර්ධනය 27
2.7 ශ්‍රමික කටයුතු 28
2.8 තරුණ, ක්‍රීඩා කටයුතු , ප්‍රාදේශීය සංවර්ධනය 29
2.9 ප්‍රාදේශීය සංවර්ධන අංශය 31
2.10 ලෝක ආහාර වැඩසටහන 31
2.11 ලෝක බැංකු අරමුදල් සහිත ආයෝජන ව්‍යාපෘති වල හදිසි ප්‍රතිචාර සංරචක 40
03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 43

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 43
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 44
3.3 මුදල් ප්‍රවාහක පිළිබඳ ප්‍රකාශය 45

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 46

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 46
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 46
3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙමදෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 47
3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය 47
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 48

04 පරිච්ඡේදය -කාර්ය සාධන දර්ශක 48
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 48

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 48

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 48
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 49

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 49

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 49
6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය කරනු ලබන බලපෑම 50
6.3 මානව සම්පත් සංවර්ධනය 50

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 53

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැදින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනියුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

### මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම


### අරමුණු

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති යෝජනාඇගයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම
- අවශ්‍ය විටෙක සැලසුම් ක්‍රම යාවත්කාලීන කිරීම
- අවශ්‍ය විටෙක ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට මාර්ග උපදේශ සැපයීම
- අවශ්‍ය විටෙක විශේෂ/ කලාපීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- නිකුත් කිරීමේ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නිර්දේශිත ව්‍යාපෘති සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීම දක්වා)
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

## 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලීම පිණිස දෙපාර්තමේන්තුව අංශ 8 කට වෙන් කර ඇත. එම අංශ 8 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ වලට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම, රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්තිය සැකසීම, ප්‍රතිපත්ති සැකසීම සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත සහයෝගය ලබා දීම සහ අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

### දෙපාර්තමේන්තුවේ අංශ

- සංචාරක,කර්මාන්ත සහ වෙළෙඳ
- කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් , ධීවර, වැවිලි ,පරිසර හා ආපදා කළමනාකරණය
- මාර්ග, වරාය, ගුවන් සේවා , ප්‍රවාහන ,විදුලිබල හා බලශක්තිය,ජල හා සනීපාරක්ෂක සේවා
- නාගරික සංවර්ධන සහ නිවාස
- සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය
- රාජ්‍ය කළමනාකරණය, යහපාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු සහ සාර්ව ආර්ථික සංවර්ධනය
- ශ්‍රමික කටයුතු
- තරුණ, ක්‍රීඩා කටයුතු සහ ප්‍රාදේශීය සංවර්ධනය
- ප්‍රාදේශිය සංවර්ධන අංශය
- ලෝක ආහාර වැඩසටහන

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්

## 1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1. **ව්‍යාපෘතියේ නම:** ලෝක බැංකු අධාර මත ක්‍රියාත්මක ආයෝජන ව්‍යාපෘති වල හදිසි ප්‍රතිචාර සංරචකය
2. **ආධාර දෙන ආයතනය:** ලෝක බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය -** රු.මිලියන 10,491
4. **ව්‍යාපෘති කාලය:** 2020.09.30 – 2023.03.30

1. ව්‍යාපෘතියේ නම: Promoting Autonomy, Literacy and Attentiveness through Market Alliances (PALAM/A)
2. ආධාර දෙන ආයතනය : එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රජයේ මුදල්
3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ඇමරිකන් ඩොලර් මිලියන26 සහ රුපියල් මිලියන 140
4. ව්‍යාපෘති කාලය : **2021 -2024**

1. **ව්‍යාපෘතියේ නම: ලෝක ආහාර වැඩසටහන**
2. **ආධාර දෙන ආයතනය: ලෝක ආහාර වැඩසටහන** (WFP)
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය - රු.මිලියන** 46.5
4. **ව්‍යාපෘති කාලය:** 2018-2022

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සංචාරක, කර්මාන්ත සහ වෙළෙඳ

### සංචාරක අංශය

විදේශ විනිමය ඉපැයීම් සහ පහසුවෙන් සංවර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් වන සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැදගත්ම අංශයක් ලෙස හඳුනාගෙන ඇත. සංචාරක ව්‍යාපාරය පරිසර සහ දේශීය සංස්කෘතික හිතකාමී කර්මාන්තයක් ලෙස පුළුල් ජනතා සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වෙතත්, 2019 සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ 2020 දී ඇති වූ කොවිඩ්-19 වසංගතය සහ 2022 වර්ෂයේ රටේ උද්ගත වූ ආර්ථික අර්බුදය වැනි හේතු නිසා රටේ සංචාරක කර්මාන්තයට විනාශකාරී බලපෑමක් එල්ල වී ඇත. ඒ අනුව සංචාරක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන නැවතත් ශ්‍රී ලංකාව විදෙස් සංචාරකයින්ගේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින අතර ඒ අනුව 2022 වර්ෂයේ අග භාගයේ සිට විදෙස් සංචාරකයින්ගේ පැමිණීමේ පැහැදිලි වර්ධනයක් හඳුනාගත හැකිය. සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සහ ආංශික සංවර්ධන සැලසුම් සඳහා නිරීක්ෂණයන් සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ සංචාරක අංශයේ ප්‍රධාන දායකත්වය වේ. ඒ අනුව,

- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 1 ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 4 ක් ඇගයීමට ලක් කර ඇත.
- කෙටුම්පත් කරන ලද ජාතික සංචාරක ප්‍රතිපත්තියට නිරීක්ෂණ ලබා දීම.
- ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම - 2050 සඳහා සංචාරක අංශයට අදාලව නිරීක්ෂණ ලබා දීම.
- 2022 අයවැය යෝජනාව සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ ආසියානු සංවර්ධන බැංකුවේ සංචාරක අංශයේ ප්‍රතිපත්ති ඇගයුම් උපදේශන දූත මෙහෙවර

සඳහා වූ සහය සටහන (aid memoire on ADB Tourism Sector Policy Assessment Consultation Mission) සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**කර්මාන්ත අංශය**

ආර්ථික සංවර්ධනය සහ ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා කාර්මීකරණය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කාර්මීකරණය හරහා සිදුවන පරිවර්තනය රටේ ආර්ථික සහ අපනයන වර්ධනයට, ආදායම් සහ රැකියා උත්පාදනයට, සහ දරිද්‍රතාවය අඩු කිරීමට දායක වේ. මූලික වශයෙන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් කෘෂිකාර්මික අංශය සහ සේවා අංශයට සමානව, පසුගිය වසර දෙක තුළ රටේ කර්මාන්ත අංශයේ ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු පසුබෑමක් සිදුවී ඇති අතර බොහෝ නැගී එන ආර්ථිකයන් හා සසඳන විට ශ්‍රී ලංකාවේ කාර්මීකරණයේ ස්වභාවය එතරම් සතුටුදායක නොවේ. රටේ බොහෝ ප්‍රධාන ආර්ථික අංශවලට සමානව වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම අහිතකර තත්ත්වය තවදුරටත් වර්ධනය වී ඇත. අධික ඉන්ධන පිරිවැය, අධික මූල්‍ය පිරිවැය, විදුලි කප්පාදු, වෙළඳපල දුර්වලතා ආදී හේතු නිසා කර්මාන්ත අංශයේ වර්ධනය අඩාල වී ඇත. කෙසේ වෙතත්, කර්මාන්ත අංශය අඛණ්ඩව රටේ ජාතික ආර්ථිකයේ සැලකිය යුතු කොටසක් ආවරණය කර ඇති අතර, දළ දේශීය නිෂ්පාදනය සඳහා දළ වශයෙන් සියයට 26 ක්, මුළු සේවා නියුක්තියෙන් සියයට 28 හා රටේ සමස්ත අපනයන සඳහා දළ වශයෙන් සියයට 80 ක දායකත්වයක් සපයයි.

මෙම පසුබිම තුළ, අවම අහිතකර පාරිසරික බලපෑම් යටතේ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට, ඉහළ අපනයන වර්ධනයක් සහතික කිරීමට සහ රටේ තිරසර සංවර්ධනයට දායක වීමට මෙන්ම අහිතකර බාහිර පරිසරයන් හමුවේ පහත වැටෙන කාර්මික නිෂ්පාදනය යථා තත්ත්වයට පත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග අවශ්‍ය බව කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය අවධාරණය කරයි.

මෙයට සමගාමීව, ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ තරඟකාරීත්වය ඉහළ නැංවීම සහ කාර්මික සංවර්ධනයට ඇති බාධාවන් මඟහරවා ගැනීම අරමුණු කරගනිමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

- කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබුණු ව්‍යාපෘති යෝජනා 28 ක් ඇගයීම.
- කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 5 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද නව යෝජනා ඇතුළත් කරමින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති පෙළ ගැස්ම (project pipeline) යාවත්කාලීන කිරීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලව සුදුසු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට සහ අදාළ රේඛීය ආයතනවලට අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීම සහ 1990 අංක 46 දරණ කාර්මික ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පත් ලේඛන සමාලෝචනය කර අවශ්‍ය නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීමට අදාළ වැඩමුළු සහ රැස්වීම්වලට සහභාගී වී අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන සහ විදේශ දූත මණ්ඩල ඇතුළු රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී වීම.

**වෙළඳ අංශය**

පසුගිය කාල වකවානුව තුල ශ්‍රී ලංකාවේ විදේශ අංශය ගෝලීය ආර්ථික සංවර්ධන සහ 2020 වසර මුල් භාගයේ පැතිර ගිය ගෝලීය වසංගත තත්වය හමුවේ  අභියෝගයන්ට ලක් විය. අපගේ විදේශ අංශය තුල පසුගිය වසර ගණනාවක් පුරාවට යහපත් වර්ධනයක් නොපෙන්වූ අතර අඛණ්ඩව පැවති යේ ඉහලයන වෙළඳ හිඟයකි.  කෙසේවෙතත්, 2022 දී අපගේ වෙළඳ ශේෂය 2021 වසරේ පැවති ඇ.ඩො මිලියන 8,139 ක අගයේ සිට ඇ.ඩො මිලියන 5,185 ක් දක්වා තියුණු පහල යාමක් පෙන්වූ අතර මෙය ආර්ථික අවපාතයත් සමග අපනයන 2021 වසරට සාපේක්ෂව 36.4% කින් අඩුවීම සහ  ආනයන 2021 වසරට සාපේක්ෂව 7.7% කින් අඩුවීම හේතුවෙන් වාර්තා විය.

පවත්නා ආර්ථික පසුබෑම සහ දැඩිලෙස රාජ්‍ය වියදම් පාලනය කිරීම මධ්‍යයේ ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන ආ ජාතික හා අන්තර්ජාතික වෙළඳ සමබරතාවය 2022 වසරේ බිඳවැටීමකට මුහුණදෙන ලදී. එබැවින් මෙම අංශ තුලද සංවර්ධන ක්‍රියාකාරකම්  සඳහා රාජ්‍ය මුදල් දායකත්වය බෙහෙවින් අඩුවීමක් සිදුවූ හෙයින් මෙම අංශයට අදාලව අප දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා එහි ප්‍රමුඛත්වයට මුල්තැනක් දෙමින් ඇගයීමට ලක්වුණු අතර  එම ව්‍යාපෘති විකල්ප මූල්‍ය මාර්ග ඔස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි අවධානය යොමුකරන ලදී. ඒ අනුව අදාළ රේඛිය අමාත්‍යාංශය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සාකච්ඡා කොට විදේශ ආයෝජන සඳහා ඉහල හැකියාවක් පැවති  ව්‍යාපෘති යෝජනා විදේශ ප්‍රදාන ලබාගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකාවේ පවත්නා ආනයන වෙළඳපොල තවදුරටත් විවිධාංගිකරණය කිරීම සහ පුළුල් කිරීම මූලික අරමුණ කරගනිමින් ඒ සඳහා අවශ්‍ය ර් -වාණිජ ක්‍රියාකාරකම් සහ ඩිජිටල්කරණය ආදී යටිතල  පහසුකම්  ඇතිකිරීම සම්බන්ධයෙන්ද අවධානය යොමුකරන ලදී.

ඊට සමගාමීව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වෙළඳ අංශය මගින් 2022 වසර සඳහා සිදුකරනලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- වෙළඳ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකා 07ක් සඳහා අප දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ සපයන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 06 ඇගයීමට ලක්කර විදේශ ප්‍රදාන මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- අංශය තුල පවතින නව අවශ්‍යතා සලකමින් පවතින 2018-2022 ජාතික ආනයන උපායමාර්ගික සැලැස්ම 2024-2028 සඳහා නැවත සකස්කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරන ලද අතර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලදී.
- රට තුල පවත්නා හදිසි තත්වය අවධානයට ගනිමින් ඒ සඳහා සුදුසු ව්‍යාපෘති සකස්කිරීම සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යාංශය සහ අනෙකුත් අනුබද්ධ ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

## 2.2 කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත්, ධීවර, පරිසර හා ආපදා කළමනාකරණය

**කෘෂිකාර්මික අංශය**

රටේ ජනගහනයෙන් හතරෙන් පංගුවකට වඩා වැඩි පිරිසකගේ ප්‍රධානතම අංශය කෘෂිකර්මාන්තයයි. රටේ මුළු භූමි ප්‍රමාණයෙන්, ඉඩම්වලින් 40% කට ආසන්න ප්‍රමාණයක් වගා කිරීමට සුදුසු වන අතර ඉන් 65% (හෙක්ටයාර මිලියන 1.9) කට ආසන්න ප්‍රමාණයක් වගා කෙරේ. වගා කරන භෝග අතරින් වී සහ වැවිලි භෝග (ප්‍රධාන වශයෙන් තේ, රබර් සහ පොල්) වගා කෙරෙන භූමි ප්‍රමාණයෙන් 36% බැගින් වේ. කෘෂිකාර්මික අපනයන ආදායම දැනට ඇමරිකානු ඩොලර් මිලියන 2,500 ක් පමණ වේ (වාර්ෂික වාර්තාව, CBSL-2020) එය රටේ මුළු අපනයන ආදායමෙන් 20% කට ආසන්න වේ.

ආහාර සුරක්ෂිතතාව සහ අපනයන ප්‍රවර්ධනය සාක්ෂාත් කර ගැනීම කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග දෙකකි.මෙම ක්ෂේත්‍රයේ රජයේ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ ඉහළ ඵලදායි, තාක්‍ෂණය මත පදනම් වූ, තිරසාර සහ ලාභදායී කෘෂි අංශයක් සහ එමගින් ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතරම ආහාර ගුණාත්මකභාවය ඇති කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳපොලේ කෘෂි නිෂ්පාදනවල තරඟකාරිත්වය වැඩි කිරීමයි.

**බෝග කෘෂිකර්මාන්තය**

බෝග කෘෂිකාර්මික අංශය, ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට ඇති හැකියාව හේතුවෙන් 2022 දී විශේෂ වැදගත්කමක් හිමි විය. කොවිඩ් වසංගතය, අයහපත් දේශගුණික තත්ත්වයන් සහ නිෂ්පාදන යෙදවුම්වල මිල ඉහළ යාම හේතුවෙන් සැපයුම් දාම අඩපණවීමෙන් ඇති වූ ගෝලීය ආහාර අර්බුදය දේශීය ආහාර වෙළඳපොළට අහිතකර ලෙස බලපා ඇත. ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීමේ වැදගත්කම හඳුනාගනිමින් රජය විසින් ඵලදායිතාව ඉහළ නැංවීමට සහ වෙළඳපල ගතිකත්වය විධිමත් කිරීමට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ රැසක් ආරම්භ කළේය. කෘෂි නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කෘෂි යෙදවුම් උපකාරක විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්/ගොවීන් වෙත ලබා දෙන ලදී. අනාගත ව්‍යවසායකයින් සඳහා වෙළඳපොල තරඟකාරීත්වය ඇති කර ගැනීමට සහන ණය සහ අදාළ මූල්‍ය පහසුකම්ද ලබා දෙමින් වෙළඳපල ගතිකත්වය ශක්තිමත් කරන ලදී.

තවද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම අපනයන තරඟකාරිත්වය සහතික කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා රජය පියවර කිහිපයක් ගෙන ඇත. ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීම; බඩඉරිඟු, අර්තාපල්, ළූණු, රටකජු , මිරිස්, තල, මුං, කව්පි, උඳු, මෙනේරි සහ සෝයා බෝංචි ස්වයංපෝෂිත මට්ටමට ගෙන ඒම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇති අතර එමඟින් ආනයනය සඳහා විදේශ විනිමය වැයවීම අවම කිරීමට අවධානය යොමු කර ඇත. ගෘහස්ථ මට්ටමේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා ගෙවතු වගාව ප්‍රවර්ධනය කරන ලදී. අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් වාණිජ බෝග (Cash crop) නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ නව වෙළෙඳපොළවල් හඳුනාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. තවද, වෙළඳපල වටිනාකම් දාමයේ සැපයුම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා පියවර ගන්නා ලදී. කෘෂිකාර්මික වටිනාකම්

දාමයට අදාළ ගැටළු සඳහා විසඳුම් ලබා දෙමින් ගොවිතැන, අස්වනු නෙලීම, පසු අස්වනු කළමනාකරණය, අගය එකතු කිරීම සහ අලෙවිකරණය යන ක්ෂේත්‍රවල තාක්‍ෂණික ව්‍යාප්තිය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

**ඉටුකරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 13 ක් ඇගයීම් සිදු කර එහි නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
- කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් අමාත්‍ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කර ඇත.

**විශේෂ කාර්යයන්**

- " Inclusive Rural livelihood transformation Project" නමින් ග්‍රාමීය ජීවනෝපාය නංවාලීම සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කර ලෝක බැංකු මූල්‍ය පහසුකම් සපයා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) විසින් සංවිධානය කරන ලද ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතිය සහ අදාළ අමාත්‍යාංශවල නිලධාරීන් සමඟ පැවති සංවාදයට පාර්ශවකරුවකු ලෙස සහභාගී විය.
- "Inputs Requirement for Agriculture Food/Crop Production – Maha 2022/23 " පිළිබඳ වාර්තාවක් සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ, ආහාර සුරක්ෂිතතා අංශය විසින් ලබා දුන් උපදෙස් පරිදි "Fertilizer Requirement for Maha/Next 6 Months (June-Dec)" පිළිබඳ වාර්තාවක් සකස් කර ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීම.
- "Sri Lanka: Emergency Recovery and Restoring Macroeconomic and Social Stability Emergency Action Plan" යනුවෙන් සංවර්ධන පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව සඳහා හදිසි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන ලදී.
- අර්බුදකාරී කාල පරිච්ඡේදය තුළ කුඩා පරිමාණ ගොවීන්ට සහ ධීවරයින්ට ඉන්ධන සැපයීම සඳහා චීනයෙන් සහ එක්සත් ජනපදයෙන් ආධාර ලබා ගැනීම පිණිස ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා පිළියෙළ කර ඉදිරිපත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා අංශය විසින් සංවිධානය කරන "ආහාර සුරක්ෂිතතාව සඳහා ජාතික ඒකාබද්ධ යාන්ත්‍රණය සහ පෝෂණය " වැඩ සටහන පිළිබඳ පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා සහභාගී විය.
- "ගෘහස්ථ පරිභෝජනය සඳහා සහල් ලබා ගැනීමේ හැකියාව" පිළිබඳ අධ්‍යනයක් සිදු කර වාර්තාවක් සම්පාදනය කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර ප්‍රතිපත්ති කමිටු රැස්වීම්වල සහභාගී වී අවශ්‍ය තාක්ෂණික සහාය සැපයීම.

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල මිලියන 1.6 ක පමණ ජනගහනයකට පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා දායක වන ප්‍රධාන උප අංශයකි. දළ දේශීය නිෂ්පාදිතයට 1% කට වඩා අඩු දායකත්වයක් දැක්වුවද, එම ක්ෂේත්‍රය සඳහා වන

ශ්‍රම අවශ්‍යතාවය හේතුවෙන්, ග්‍රාමීය රැකියා උත්පාදනය, දරිද්‍රතාවය පිටුදැකීම සහ එමගින් ආර්ථික සංවර්ධනයට මග පෑදීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට එය එක් වේ. මෙම අංශයට ප්‍රධාන වශයෙන් ගවයින්, මී හරකුන්, එළුවන්, කුකුළන් සහ ඌරන් ඇතිකිරීම අයත් වේ. රට තුළ ලියාපදිංචි සත්ව ගොවිපළ 600,000ක් පමණ ඇත. තවද කිරි ගොවීන් 250,000ක් ඇතුළුව ආසන්න වශයෙන් පවුල් ඒකක 600,000ක් සෘජුවම මෙම අංශයේ නියැලී සිටිති.

මේ වන විට දේශීය දියර කිරි නිෂ්පාදනය දළ වශයෙන් ලීටර් මිලියන 427 ක් වන අතර එය රටේ සමස්ත ඉල්ලුමෙන් සියයට 50 ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් වේ. එබැවින් නිෂ්පාදනය වැඩි කිරීම සහ දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකාබද්ධ වාණිජකරණය වූ ගොවිතැනක් කරා පරිවර්තනයක් මෙම අංශයට අවශ්‍ය වේ. මේ සඳහා දේශීය මෙන්ම දෙමුහුම් සත්ත්ව ප්‍රභේද යොදා ගනිමින් සිදු කෙරෙන සාර්ථක අභිජනන ක්‍රමවේදයන් සඳහා සහ වසර පුරා සත්ත්ව ආහාර සුලබතාවය ඇති කිරීම සඳහා පුළුල් ප්‍රවේශයන් අවශ්‍ය වේ.

කුකුල් කර්මාන්තය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර කුකුළු මස් හා බිත්තර සඳහා වන ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීමට එයට හැකිව ඇත. බොහෝ දුරට කුකුළන්ගේ සෞඛ්‍ය තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ක්ෂේත්‍රය තවදුරටත් ස්ථාවර කිරීම සඳහා පර්යේෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධනය යන කටයුතු සඳහා පමණක් රජයේ කාර්යභාරය සීමා වී ඇත. කුකුළු මස් සහ බිත්තර ලාභම සත්ව ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස පිළිගෙන ඇති බැවින් රටේ සත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිෂ්පාදන පිරිවැය අඩු කර නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ.

**ඉටු කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 04 ක් ඇගයීම් සිදු කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- පශු සම්පත් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 3ක් සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් අමාත්‍ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්**

- 2022 අයවැය කතාවට ඇතුළත් කිරීමට "සත්ත්ව අභිජනනය වැඩි දියුණු කිරීම හරහා ගෘහස්ථ කිරි නිෂ්පාදනය වැඩි කිරීම" යන මැයෙන් අයවැය යෝජනාවක් පිළියෙළ කර 2022 අයවැය කතාවට ඇතුළත් කිරීම.

**ඉඩම් හා වාරිමාර්ග අංශය**

රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, නව ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම සහ පවතින ජල සම්පත වැඩි දියුණු කිරීමත් සමඟ සුදුසු, සාධාරණ ජලය බෙදා හැරීම සහතික කිරීම සඳහා වාරිමාර්ග අංශය අත්‍යවශ්‍ය වේ. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන්වල අවසන් අදියරේ වැඩකටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම නව ව්‍යාපෘති රැසක් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ආරම්භ කර ඇති අතර ඒ යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන යන

ව්‍යාපෘති ප්‍රධාන වේ. කෙසේ වෙතත්, රටේ පවතින වත්මන් මූල්‍ය තත්ත්වයත් සමඟ, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය අවශ්‍ය විකල්ප සමඟ නැවත නිරීක්ෂණය කර ඇත. කෙසේ වෙතත්, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා එහි ඍජු දායකත්වය හේතුවෙන් එල්ලංගා සංවර්ධනය හරහා ජල සම්පත් සංවර්ධනය ප්‍රමුඛ මැදිහත්වීමක් ලෙස හඳුනාගෙන ඇත. තවද, ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා ජල ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම හෝ අවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදු කෙරේ. මිනිසුන්ට සහ භෝග සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා භූගත ජලය උපයෝගී කර ගැනීම සහ වැසි ජලය රැස් කිරීම ද ගවේෂණය කෙරේ.

**ඉඩම් සම්පත**

ප්‍රයෝජනයට නොගත් සහ ඌන උපයෝගිතා ඉඩම් ඵලදායී භාවිතය සඳහා ගෙන ඒම ආර්ථිකය නංවාලීමේ මූලික අවශ්‍යතාවක් ලෙස පිළිගැනේ. ඉඩම් සම්පතේ ඵලදායිතාව ඉහළ නැංවීම, තරඟකාරීත්වය සහ ආදායම වැඩි කිරීම සඳහා තීරණාත්මක සාධකයකි. එබැවින් හොඳම විකල්පය සඳහා ඉඩම් භාවිතා කිරීම අනෙකුත් යෙදවුම් අවශ්‍යතා සමඟ එක්ව ආර්ථිකය නංවාලීම සඳහා උපකාරී වේ. ඉඩම් බැංකුවේ ප්‍රවේශය ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත්තේ ආර්ථිකයේ ආයෝජන සහ වර්ධනය ඉහළ නැංවීම සඳහා ය. මෙම සංකල්පය ප්‍රධාන නියෝජිතායතනය ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් භාර ගනු ලබන අතර අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ද ලැබේ. මීට අමතරව, "බිම්සවිය" වැඩසටහන පසුගිය වසර කිහිපය පුරා ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රධාන වශයෙන් ලබන්නේ ඉඩම් පරිහරණය සහ සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අදහසින් වඩාත් ශක්තිමත් සහ නිරවුල් ඉඩම් අයිතිය ලබා දීම සඳහා මෙන්ම ඉඩම් හිමිකම හෝ සීමා මායිම් හේතුවෙන් ඇති වන අනවශ්‍ය ආරවුල් මඟහරවා ගැනීම අරමුණු කර ගෙන ඇත. අවශ්‍ය පරිපාලන හා නීතිමය සංශෝධන සහිතව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සුදුසු පරිදි වේගවත් කර ඇත.

සංචාරක හා ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ව්‍යාපෘති ඇගයීම, කැබිනට් සංදේශ සලකා බලමින් නිරීක්ෂණයන් සැපයීම මෙම අංශයේ (Agriculture Cluster) ප්‍රධාන දායකත්වය වේ.

**ඉටුකරන ලද කාර්යයන්**

- ඉඩම් හා වාරිමාර්ග අංශයවලට අදාලව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජන 12 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 25 ක් ඉදිරිපත් කරන ලදි.
- මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම්වලට සහභාගි වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව Aide Memoire සඳහා නිරීක්ෂණ ලබා දීම.

**වැවිලි අංශය**

වැවිලි අංශය රටෙහි සමස්ත අපනයන ආදායමට දක්වන දායකත්වය සියයට 27ක් පමණ වන අතර වැවිලි අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා පිරිස මිලියන 1.5ක් පමණ වේ.

වැවිලි අංශයේ ප්‍රධාන අමාත්‍යාංශය වන වැවිලි අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ආංශික ප්‍රතිපත්තිමය කරුණු වලට තාක්ෂණික සහය ලබා දීම සහ එම අමාත්‍යාංශ සහ අමාතයංශ යටතේ වන ආයතන මගින් ලබා දෙන සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් ව්‍යාපෘති විශ්ලේෂණය, නිර්දේශ ලබා දීම මෙන්ම ව්‍යාපෘති සැළසුම් කරණෙයහිලා අවශ්‍ය තාක්ෂණික කරුණු ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. වැවිලි අංශයේ නිශ්පාදනය හා ඵලදායිතාවය වැඩි කරමින් වැවිලි අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා ජනතාවගේ ජීවනොපාය සුරක්ෂිත කිරීමත් රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව වැවිලි ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහයෝගය සහ තාක්ෂණික සහය ලබා දීමත් මෙම අංශය මගින් සිදු කෙරේ.

**ඉටුකරන ලද විශේෂ කාර්යන්**

- රජයේ දස අවුරුදු සැලැස්මේ වැවිලි අංශයේ පරිච්ඡේදය සකස් කර අවසන් කිරීම.
- ව්‍යාපෘති වාර්තා ඇගයීමට අදාලව අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් අදාල ආයතන සමග රැස්වීම් 06ක් සංවිධානය කර පැවැත්වීම.
- ලෝක බැංකු ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට අවශය සහාය ලබා දීම.
- Aid Memorie, Country Diagnosis Studies (CDS) සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දීම.
- මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා දායකත්වය ලබා දීම.
- කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP) සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් පිළියෙල කර අදාල ආයතනවලට ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.

**ප්‍රගතිය 2022**

| | |
|---|---|
| ලැබුණු ව්‍යාපෘති වාර්තා ගනන | 43 |
| ඇගයීම් කළ ව්‍යාපෘති වාර්තා ගනන | 43 |
| ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | Ob-02 Co- 02 |
| නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | Ob-02 Co- 02 |

**ධීවර අංශය**

ධීවර අංශය රටෙහි දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 1 ක් පමණ වන අතර ධීවර අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා පිරිස මිලියන 2.8 පමණ වේ.

ධීවර අංශයේ ප්‍රධාන අමාත්‍යාංශය වන ධීවර අමාත්‍යාංශය සහ ඒ ආශ්‍රිතව ඇති ධීවර අංශයට අදාල රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ආංශික ප්‍රතිපත්තිමය කරුණු වලට තාක්ෂණික සහය ලබා දීම සහ එම අමාත්‍යාංශ සහ අමාතයංශ යටතේ වන ආයතන මගින් ලබා දෙන සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් ව්‍යාපෘති විශ්ලේෂණය, නිර්දේශ ලබා දීම මෙන්ම ව්‍යාපෘති සැළසුම් කරණයෙහිලා අවශ්‍ය තාක්ෂණික කරුණු ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ධීවර අංශයේ නිශ්පාදනය, ඵලදායිතාවය සහ යටිතල පහසුකම් වැඩි කරමින්

ධීවර අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා ජනතාවගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීමත් රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව ධීවර ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහයෝගය සහ තාක්ෂණික සහය ලබා දීමත් මෙම අංශය මගින් සිදු කෙරේ.

**ඉටු කරන ලද විශේෂ කාර්යන්**

- රජයේ දස අවුරුදු සංවර්ධන සැලැස්මේ ධීවර අංශයේ පරිච්ඡේදය සකස් කර අවසන් කිරීම.
- උතුරු පලාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා සම්බන්ධීකරණ දායකත්වය ලබා දීම.
- ලෝක බැංකු ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට අවශය සහාය ලබා දීම.
- ව්‍යාපෘති වාර්තා ඇගයීමට අදාලව අමාත්‍යංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් අදාල ආයතන සමග රැස්වීම් 08ක් සංවිධානය කර පැවැත්වීම.
- Aid Memorie, Country Diagnosis Studies (CDS) සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දීම.
- JICA ආයතනය සමඟ ව්‍යාපෘති වාර්තා සකස් කිරිම සම්බන්ධයෙන් ධිවර අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම

**ප්‍රගතිය 2022**

| | |
|---|---|
| ලැබුණු ව්‍යාපෘති වාර්තා ගනන | 6 |
| ඇගයීම් කළ ව්‍යාපෘති වාර්තා ගනන | 6 |
| ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | Ob-2 Co- 04 |
| නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශ ගනන | Ob-2 Co- 04 |

**පරිසර කළමනාකරණය**

නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සපසන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛවවිවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ සුවාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. තරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජෛව විවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

පරිසර කළමනාකරණ අංශය ලබා කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන මාධ්‍ය කාලීන ඉලක්ක කිහිපයක් ඉලක්ක කිහිපයක් ලෙස 1 කෘෂිකර්මාන්තය, සත්ව පාලනය සහ වැවිලි කර්මාන්තයේ තිරසාර ඉඩම් භාවිතය සඳහා ජාතික භෞතික සැලැස්ම නැවත සමාලෝචනය කර සකස් කිරීම. 2023 වන විට හෙක්ටයාර 3000 ක වන සනත්වයක් පවත්වා ගැනීම සඳහා වනාන්තර ප්‍රදේශ හෙක්ටයාර 1220 ක් සහ වනාන්තර හෙක්ටයාර 2150 ක් නැවත සකස් / ප්‍රතිසංස්කරණය කිරීම.3. 2023 වන විට හෙක්ටයාර 1000 ක වන සනත්වක් නැවත ප්‍රතිසංස්කරණය කිරීම සහ හෙක්ටයාර 1600 ක වන වන කළමනාකරණය කිරීම. 4. වගුරුබිම් හා කඩොලාන කෙරෙහි මානව බලපෑම් පාලනය කිරීම තුළින් සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කිරීම.5. 3R (අඩු කිරීම, නැවත භාවිතය සහ නැවත චක්‍රය) සංකල්පය පරිසර-කාර්මික කලාප පිහිටුවීම තුළින්, අපද්‍රව්‍ය උත්පාදනය / අපද්‍රව්‍ය වර්ගීකරණය පිළිබඳ දැනුවත් කිරීම සහ අපද්‍රව්‍ය වර්ග කිරීම සහ ගෘහස්ත / කර්මාන්ත මට්ටමින් වෙන් කිරීම අනිවාර්ය කිරීම.6. සාගරය දූෂණයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම තුළින් වෙරළබඩ ප්‍රදේශ සහ සාගර පරිසරය ආරක්‍ෂා කිරීම සහ7. ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ හා බැහැර කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම (සායනික හා කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ දහන යන්ත්‍ර සඳහා සනීපාරක්ෂක ඉඩම් පිරවුම් හඳුන්වා දීම සඳහන් කල හැක.

**ඉටුකරන ලද කාර්යයන්**

- පරිසර අමාත්‍යාංශය, වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා අදාල වෙනත් රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 53 ක් සඳහා යෝජනා, නිරීක්ෂණ ඉදිරිපත්කිරීම හා ඇගයීමට ලක් කිරීම.
- ජාතික පරිසර ප්‍රතිපත්තිය, රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ජපානය සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කාබන් ණයකරණ යාන්ත්‍රණය (JCM) ක්‍රියාත්මක කිරීම, රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඇතුළු අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල සංදේශ 16 කට නිරීක්ෂණ සැපයීම.
- UNESCAP ආයතනය විසින් ඉදරිපත් කරන ලද ශ්‍රී ලංකාව සඳහා වන හරිත බැඳුම්කර රාමුව සඳහා වන (Green Bond Framework- ZERO DRAFT) කෙටුම්පත සංශෝධනය කිරීම.
- යුරෝපානු සංගමය (EU) මගින් අරමුදල් සපයනු ලබන හරිත ප්‍රතිපත්ති පහසුකම් ව්‍යාපෘතිය (Green Policy Dialogue Facility Project) සඳහා අදහස් හා යෝජනා ලබා දීම.
- ශ්‍රී ලංකාව සඳහා කාබන් ශුන්‍ය මාර්ග සිතියම සහ උපාය මාර්ගික සැලැස්ම (Carbon Net Zero Road Map and Strategic Plan) ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනවල තාක්ෂණික ධාරිතා වර්ධනය සඳහා වන වැඩසටහන සඳහා අදහස් හා යෝජනා ලබා දීම.
- සමුද්‍රීය රටවල සහයෝගිතා වැඩසටහන (Blue Planet Fund- Ocean Country Partnership Program) (BPF –OCPP) අවබෝධතා ගිවිසුම සහ වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය සහ ඇමරිකා එක්සත් ජනපදයේ කර්නල් විශ්වවිද්‍යාලය (Cornell University) සමඟ ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුම ඇතුළු අවබෝධතා ගිවිසුම් සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා රජය සහ ගෝලීය හරිත වර්ධන ආයතනය (Global Green Growth Institute -GGGI) අතර අවබෝධතා ගිවිසුම සඳහා අදහස් හා යෝජනා ලබා දීම.

- USAID සමුද්‍රීය ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම් සඳහා වන ව්‍යාපෘතිය (USAID Ocean Plastic Reduction Activity) සඳහා අදාළ පාර්ශවකාර ආයතන සමඟ මූලික කටයුතු ආරම්භ කිරීම.
- දේශගුණික මූල්‍ය ජාලය (Climate Finance Network) පිළිබඳ ව්‍යාපෘති යෝජනාව තවදුරටත් වර්ධනය සඳහා මුදල් අමාත්‍යාංශයේ අවශ්‍යතා අනුව සකස් කරන ලද යෝජනා ලබා දීම.
- පාරිසරික කළමනාකරණ අංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දීම
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ යෝජිතායතනවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- විදේශීය දූත මණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම.

**අපදා කළමනාකරණය**

ආපදාවකට මුහුණ දීම සඳහා සම්පත් සංවිධානය කිරීම හා මෙහෙයවීම ලෙස ආපදා කළමනාකරණය හැඳින්විය හැකිය. තවද, එයට අදාල වගකීම අපදා සඳහා මුහුණ දෙන්නන්, පෞද්ගලික අංශයේ සංවිධාන, රාජ්‍ය අංශයේ ආයතන, ස්වේච්ඡා සේවකයන්, පරිත්‍යාගශීලීන්ගේ යන සියලු දෙනාගේ භූමිකාවන් හා වගකීම වන අතර මනා සම්බන්ධීකරණයෙන් සිදු කල යුතුවේ . ආපදා කළමනාකරණයේ මූලික අරමුණ වනුයේ ඊට අදාලව සූදානම වීම , ප්‍රතිචාර දැක්වීම, නැවත යතා තත්වයට පත් වීම සහ අවම කිරීමට තුළින් ඇති වන බලපෑම් අවම කිරීමයි.

වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකුලව ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට ආපදා අවදානම් අඩු කිරීමෙහි ඇති වැදගත්කම අවධාරණය කරන අතර ආයතනික සංවර්ධනය, බහු උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වැනි අංශයන් යටතේ අපදා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය විසින් දළ වශයෙන් රුපියල් බිලියන 4 කට අසන්න ප්‍රමාණයක් වාර්ෂිකව වැය කරනු ලැබේ . තවද, සෙන්දායි රාමුව වැනි ජාත්‍යන්තර වගකීම් වලට අනුකූලව, ආපදා අවදානම වටහා ගැනීම, ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම තුළින් ස්වභාව ධර්මය හෝ මිනිසා විසින් ඇති කරන ලද හෝ පාරිසරික, තාක්‍ෂණික හා ජීව විද්‍යාත්මක ගැටලු හේතුවෙන් ඇති වන අවදානම් සෑම ආකාරයකින්ම අඩු කිරීමට අපේක්‍ෂා කරන අතර ඒ හරහා ආපදා අවදානම අඩු කිරීම සඳහා ආයෝජනය කිරීම, ඵලදායි ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා සූදානම වර්ධනය කිරීම සහ ප්‍රතිසාධනය, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය කිරීමට ආපෙක්ෂා කෙරේ.

**ප්‍රධාන මධ්‍යකාලින ඉලක්ක.**

නායයාමේ අවදානම් තක්සේරු සහතික නිකුත් කිරීම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ රසායනාගාර පහසුකම් පුළුල් කිරීම, නාය යෑම් විමර්ශන, පර්යේෂණ හා සංවර්ධන, නායයෑමේ අවදානම් පැතිකඩක් සංවර්ධනය කිරීම, ස්වයංක්‍රීය වැසි මිනුම් ජාලය පුළුල් කිරීම කිරීමෙන් තත්‍ය කාලීන නාය යාමේ අනාවැකි සහ කලින් අනතුරු ඇඟවීමේ ධාරිතාව වැඩි කිරීම,සසුදුසු අවධානම් අඩු කිරීමේ පියවර තුලින් නාය යාමේ අවදානම අඩු කිරීම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම් පිළිබඳ ක්‍රමානුකූල විනිශ්චය තක්සේරුවක් ආරම්භ කිරීම අඛණ්ඩව කරගෙන යාම, වසර 2030 වන විට සෙන්දායි රාමුවේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කිරීම සහ ආපදා

කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා පුද්ගලික අංශයේ අභ්‍යන්තර හැකියාවන් සහ සම්පත් වැඩි දියුණු කිරීම සඳහා බැංකු, කර්මාන්ත සහ අනෙකුත් රාජ්‍ය ආයතන (විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය) අතර සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම තුළින් සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම මාධ්‍ය ඉලක්ක කිහිපයක් ලෙස සඳහන් කල හැක.

**ඉටුකරන ලද කාර්යයන්**

- ආපදා කළමනාකරණයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 03 ක් ඇගයීමට ලක් කිරීම.

- ජාතික නිර්ණය කළ දායකත්ව පාඩු හා හානි ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණ සැලැස්ම (Loss and Damage NDC Implementation and Monitoring Plan) සඳහා නිරීක්ෂණ ලබාදීම.
- 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලස්ම පිළියෙල කිරීම සඳහා සහය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම
- ව්‍යාපෘති යෝජකයන්ට සහ ඇගයුම්කරුවන්ට මඟ පෙන්වන ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ (project submission format) 14 වැනි අයිතමයට අනුකූලව ආපදා අවදානම් අවම කිරීමේ) DRR) අත්පොත සකස් කිරීම සඳහා මඟ පෙන්වීම සහ සහාය ලබා දීම.
- ආපදා කළමනාකරණ අංශය (Disaster management sector) සඳහා ප්‍රතිසාධන සැලැස්මක් (Recovery plan) සකස් කළ අතර විශේෂයෙන් COVID හි බලපෑම් මෙන්ම රටේ දැඩි මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් වසර 10 ක සංවර්ධන සැලැස්ම-2030 කෙටුම්පත් කරන ලදී.
- ආපදා අවධානම කළමනාකරණය පිළිබඳ ආයතනික කාර්යභාරයන් මත පදනම්ව ප්‍රජාව වෙත සේවා සැපයීම පිළිබඳ කෙටුම් පත පිළියෙල කිරීම සඳහා සහය ලබාදීම.

## 2.3 මාර්ග, වරාය, ගුවන් සේවා, ප්‍රවාහන, විදුලිබල හා බලශක්තිය, ජල හා සනීපාරක්ෂක සේවා

**මාර්ග, වරාය, ගුවන් සේවා, ප්‍රවාහන, ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා**

2022 වර්ෂයේ ආර්ථික, සාමාජීය හා දේශපාලනික විචලතාවයන් සැළකිල්ලට ගනිමින්, පැවති අයවැය සම්පාදනය තුළ රැඳී සිටිමින් හා ව්‍යාපෘති ප්‍රමුඛතාගත කරමින් මෙම අංශයට අදාළ කාර්යයන් සාර්ථකව ඉටු කරන ලදී. ඒවා අතුරින්, අධිවේගී මාර්ග සංවර්ධනය, අනෙකුත් මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ පුනරුත්ථාපනය කිරීම, පාලම් ඉදිකිරීම, නවීකරණය තුළින් පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම, නාගරික ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම, වාහන තදබදය අවම කිරීම, මාර්ග අනතුරු අවම කිරිම, පරිසර හිතකාමී විද්‍යුත් ප්‍රවාහනය ප්‍රචලිත කිරීම, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම, පානීය ජලසම්පාදන

ව්‍යාපෘති සහ සනීපාරක්ෂක ඇතුළු ජලාපවහන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගත හැකිය.

**ඉටුකරන ලද කාර්යයන්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් 43 ක් ඇගයීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, වාරය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, ජලසම්පාදන අමාත්‍යාංශය හෝ මෙම අංශවලට අදාළව ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් තළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ සකස් කිරීම. එවැනි නිරීක්ෂණ 69 ක් ඉදිරිපත් කරන ලදී.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- පහත සඳහන් කමිටුවල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
  - සනීපාරක්ෂක ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සහ 1974 අංක 2 දරණ ජල පනත සංශෝධනය කිරීම.
  - ජාතික වාහන නියාමනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
  - බස් ගාස්තු ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධ මිල සූත්‍රය යාවත්කාලීන කිරීම.
  - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා අදහස් දැක්වීම.

**විදුලිබල හා බලශක්ති අංශය**

ශ්‍රී ලංකාව දළ වශයෙන් ටොන් මිලියන 12.8 ක (බොර තෙල් ටොන් එකකකට සාපෙක්ෂව ) බලශක්තියක් ප්‍රමාණයක් වාර්ෂිකව පරිභෝජනය කරන අතර ආනයනික බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන රටෙහි ජාතික ආර්ථිකයට ( 43%) දායක වේ. මීට අමතරව 37% කට ආසන්න ප්‍රමාණයක් ජෛව ස්කන්ධ මගින්ද , ගල් අඟුරු 11% ක මෙන්ම ජල විදුලි බලය මගින් 6% ක් සහ නව පුනර්ජනනීය ශක්තිය මගින් 3% ට ආසන්න ප්‍රමාණයක බලශක්ති ප්‍රමාණයක් භාවිතා කරනු ලැබේ . 2021 වර්ෂයෙහි, බොර තෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා, වාර්ෂිකව රු. මිලියන 700,000 වැය කරනු ලැබේ.

දැනට පවත්නා මුළු විදුලි උත්පාදනය සහ රටේ ස්ථාපිත ධාරිතාව පිළිවෙලින් ගිගාවොට් පැය 16,716 සහ මෙගාවොට් 4,186 කි. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය සැලකීමේදී එය කිලෝවොට් 687 kW/h වන අතර, රටේ වාර්ෂික විදුලි ඉල්ලුම 5.5% ක ප්‍රතිශතයකින් ඉහළ යනු ලැබේ. ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් විදුලි උත්පාදන දිරි ගන්නවන අතර එය විදුලි ජනන මිශ්‍රණයට ඒකාබද්ධ කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. දළ වශයෙන්, රටෙහි ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 30% ක් බොරතෙල් ලෙස ආනයනය කරන අතර ශේෂය පිරිපහදු කළ නිෂ්පාදන ලෙස සෘජුවම ආනයනය කරනු ලබයි . මීට අමතරව, විදුලි උත්පාදනය සහ කාර්මික යෙදුම්හි අවශ්‍යතාවයන් සඳහා ගල් අඟුරු ආනයනය කරනු ලැබේ. 2021 වර්ෂයෙහිදී, දළ වශයෙන් රු. බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාව රුපියල් මිලියන 700,000 ක් වැය කරන ලදී .

තවද රටෙහි ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතව, විදුලි ජනන මිශ්‍රණය මෙන්ම අනෙකුත් බලශක්ති අවශ්‍යතා සඳහා සඳහා පිවිතුරු බලශක්තිය එක්කිරීමට විශේෂ අවධානය යොමුකර ඇති අතර, එය රටට අවේනික, අඩු වියදම් සහිත, විශ්වසනීය ක්‍රමෝපායයන් හරහා සිදු කර ගත යුතු බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2022 වර්ෂය තුල විදුලිබල සහ බලශක්ති කක්ෂේත්‍රයෙහි උන්නතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපර්තමන්තුවේ දායකත්වය පහත පරිදි වේ.

- කැබිනට් සංදේශ 10ක් සඳහා නිරීක්ෂණ ලබාදී ඇත. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය අතර ජාතික බලශක්ති විභව තාවය , උපාය මාර්ග සහ ඉදිරි දශකය සඳහා මාර්ග සිතියම සහ පුනර්ජනනිය බලශක්ති සම්පත් සංවර්ධන සැලසුම 2021-2026 සඳහා මෙන්ම "කාබන් ණය පහසුකම් ලබාගැනීම" සිවිශේෂී දායකත්වයක් ලබාදී ඇත.
- රටේ දැනට පවතින දුෂ්කර රාජ්‍ය මුල්‍ය තත්වය හමුවේ ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතින්හි ණය ප්‍රතිව්‍යුහගත කර රටේ මහජනතාවට අත්‍යවශ්‍ය බල ශක්තිය වන ඛනිජ තෙල් හා ගෘහස්ත එල් පි ගැස් ආනනයන සඳහා පහසුකම් සලසන ලදී.
- කොවිඩ් වසංගත තත්වය සහ රටෙහි පවතින මූල්‍ය අර්බුධය හේතුවෙන් විදුලි බලක්ෂේත්‍රයට අදාලව ප්‍රතිසාධන සැලැස්මක් සහ දස අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම
- පුනර්ජනනීය විදුලි බල හා බලශක්ති, හරිත හයිඩ්‍රජන් යෝජනා ආදි ව්‍යාපෘති යෝජනා වලට නිරීක්ෂණ හා අදහස් ලබාදී ඇත.
- කොවිඩ් වසංගත තත්වය සහ රටෙහි පවතින මූල්‍ය අර්බුධය හේතුවෙන් විදුලිබල ක්ෂේත්‍රයට අදාලව ප්‍රතිසාධන සැලැස්මක් සහ දස අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම
- අදාල ආයතන සම්බන්ධ කර ගනිමින්, වහල මත සූර්ය පැනල ආශිතව පවතින අභියෝග විශ්ලේෂණය කිරීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 14 ක් ඇගයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- විදුලි බල හා බල ශක්ති උන්නතිය සහ අභියෝග ජය ගැනීම සඳහා සංකල්ප පත්‍රිකා සැදීම රාජ්‍ය ගොඩනැගිලි සඳහා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අදාල චක්‍රලේඛය සැකසීමට දායකත්වය ලබාදීම.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.

## 2.4 නාගරික සංවර්ධන සහ නිවාස

**නාගරික සංවර්ධන සහ නිවාස අංශය**

ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් ජනනය වනුයේ නගර ආශ්‍රිතවය. වසර 2000 සිට 2030 දක්වා කාලය තුල ලෝක නාගරික ජනගහනය දෙගුණ වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් තවත් බිලියන 2 ක ජනතාවක් නාගරික ප්‍රදේශවලට එකතු වනු ඇත. තවද, එම කාලය තුළ ‘‘ගොඩනගනලද නාගරික ප්‍රදේශය’’ (Built-up urban area) වර්ග කිලෝමීටර මිලියන 1.2 කින් ඉහළ යනු ඇත.

ශ්‍රී ලංකාවේ නාගරීකරණ අනුපාතය සාපේක්ෂව අඩු මට්ටමක පවතී. 2012 වසරේ පවත්වන ලද ජන හා නිවාස සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය රටේ සමස්ත ජනගහනයෙන් 18.3% කි. කෙසේ වෙතත්, වෙනත් සමහර අධ්‍යයන මගින් රටේ සැබෑ නාගරීකරණ අනුපාතය 34% සහ 50% අතර වනු ඇති බවට ඇස්තමේන්තුකර ඇත. රටේ නිවාස අංශය සලකා බැලීමේදී, සමස්ත කුටුම්භ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 18.3%ක් ස්ථිර නිවාසවල වාසය නොකරන බවට 2012 වසරේ පවත්වන ලද ජන හා නිවාස සංගණනය මගින් හෙළිදරව් වී ඇත. එපමණක් නොව, පේළි කාමර සහ පැල්පත් නිවාස ප්‍රමාණය රටේ සමස්ත නිවාස ඒකක ප්‍රමාණයෙන් දළ වශයෙන් 4.3%ක් පමණ වන බවට ගණනය කොට ඇත.

මෙම සන්දර්භය තුළ, නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් නිවාස ලබා දීම සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. ඒ අනුව විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්තිමය දෝෂ මඟහරවා ගැනීම තුලින් ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ විවිධ ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම මගින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නාගරික සංවර්ධන හා නිවාස අංශය ඒ සඳහා දායක වී ඇත.

**ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල සංදේශ/ අමාත්‍ය මණ්ඩල සටහන් 31 ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- ව්‍යාපෘති යෝජනා 23 ඇගයීමට ලක්කිරීම සහ දේශීය හෝ විදේශීය මූල්‍යකරණය සඳහා නිර්දේශ ලබා දීම
- ක්‍රියාත්මක ව්‍යාපෘති වල වෙනස්කම් සිදු කිරීම සම්බන්ධයෙන් නිර්දේශ දීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වීම
- ව්‍යාපෘති / ආංශික සංවර්ධනය පිළිබඳ වාර්තා සකස් කිරීම
- ජාතික සහ ආංශික ප්‍රතිපත්ති ලේඛන සකස් කිරීම සඳහා දායක වීම
- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහ අදාළ රාජ්‍ය අමාත්‍යාංශවල ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීම
- ආංශික සැලසුම් සහ සංවර්ධනය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

## 2.5 සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ හා සමාජ ආරක්ෂණය

**සෞඛ්‍ය අංශය**

කොවිඩ් 19 වෛරසය පාලනය හා එය සමාජගත වීම තවදුරටත් වැලැක්වීම මෙන්ම රටේ උත්ගත වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඖෂධ සහ සෞඛ්‍ය උපාංග හිඟය වලක්වා ගනිමින් රටේ සෞඛ්‍ය සේවාව වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සම්පාදනය මෙම වර්ෂය තුළදී රජයේ මූලික අභිමතාර්ථයක් විය. ජාතික ක්‍රමසම්පාදන

දෙපාර්තමේන්තුව, අදාල දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ හා එක්ව ආධාර සපයන ආයතන මඟින් අවශ්‍ය මූල්‍ය ආධාර සපයන ආයතන මගින් අවශ්‍ය මූල්‍ය ආධාර සපයා ගැනීමට පහසුකම් සපයන ලදී. ඒ අනුව, ඉන්දීය ණය වැඩසටහන, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ වෙනත් සෞඛ්‍ය ආධාර සපයන ආයතන හා එක්ව අත්‍යාවශ්‍ය ඖෂධ, ශල්‍ය උපාංග සහ රසායනාගාර ප්‍රතික්‍රියාකාරක මෙරටට ලබා ගැනීමට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘතීන් වල භවිතා නොකල ප්‍රතිපාදන ද අත්‍යාවශ්‍ය ඖෂධ, ශල්‍ය උපාංග සහ රසායනාගාර ප්‍රතික්‍රියාකාරක ලබාගැනීම සඳහා යොදවා ගැනිමට කටයුතු කරන ලදී. එසේම, දැනට සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ විදේශ ආධාර මගින් ක්‍රියාත්මක වන්නා වූ ව්‍යාපෘතීන් වල ආර්ථික අපහසුතාවය හේතුවෙන් ඇතිවූ බලපෑම කළමණාකරණය කරගැනීමට හා ඒවා වඩාත් කාර්යක්ෂමව කරගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා අනෙකුත් කළමණාකරණ මට්ටමේ තීරණ ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදී. ඒ අනුව, සමස්ථයක් ලෙස රජය විසින් 2022 වර්ෂයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මූලධන පිරිවැය වෙනුවෙන් රුපියල් මිලියන 31,097 ක් අයවැය මඟින් වෙන් කරනු ලැබූ අතර එම අරමුදල් රේඛීය අමාත්‍යාංශය සහ මුදල් කොමිෂන් සභාවේ සම්බන්ධීකරණ හරහා අදාල පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන ආයතන පවත්වාගෙන යාමට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගනු ලැබිනි.

ක්‍රියාකාරකම්

- ව්‍යාපෘති යෝජනා 16 ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07 සඳහා නිරීක්ෂණ සපයා ඇත.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති යෝජනා 03 සඳහා මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් නිරීක්ෂණ සහ යෝජනා සපයා ඇත.

- සෞඛ්‍ය අංශය සඳහා ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනා වී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ/ ලෝක සෞඛ්‍ය සංවිධානය , ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කිරීම.

**අධ්‍යාපන අංශය**

රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා මානව සම්පත් සංවර්ධනය ප්‍රධාන මෙවලමක් ලෙස හඳුනාගෙන ඇත. දැනුම පදනම් කරගත් ආර්ථිකයක් නිර්මාණය කිරීමේ දී මානව ප්‍රාග්ධනය මහඟු කාර්යයක් ඉටු කරනු ලබයි. ඒ අනුව, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයෙන් සමන්විත සාමාන්‍ය අධ්‍යාපනය දරුවන්ගේ පෞරුෂය වර්ධනයට ස්ථිරසාර අඩිතාලමක් දැමීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විධිමත් අධ්‍යාපනයේ අඩිතාලම පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයෙන් (පූර්ව ළමා විය සංවර්ධනය / පෙර පාසල්) ආරම්භ වන අතර පාසල්

අධ්‍යාපනය වසර 13 ක් පුරා විහිදී පවතී. පාසල් අධ්‍යාපනය කොටස් කිහිපයක් යටතේ දරුවන්ගේ දැනුම, කුසලතා, සහ ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින්, ප්‍රාථමික අධ්‍යාපනය 1 වන ශ්‍රේණියේ සිට 5 වන ශ්‍රේණිය දක්වාත් කණිෂ්ඨ ද්විතීක (Junior Secondary) අධ්‍යාපනය 6 වන ශ්‍රේණියේ සිට 9 වන ශ්‍රේණිය දක්වාත් ජ්‍යෙෂ්ඨ ද්විතීක (Senior Secondary) අධ්‍යාපනය 10 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වාත් ඉහළ ද්විතීක ජ්‍යෙෂ්ඨ ( Upper-Senior Secondary) අධ්‍යාපනය 12 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වාත් ලබා දෙයි. පාසල් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා 10,155 ක් වූ රජයේ පාසල් පද්ධතියට අමතරව රජයේ අනුමත ජාත්‍යන්තර පාසල් 90 ක් ද, පිරිවෙන් අධ්‍යාපන ආයතන 816 ක් ද, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ විශේෂ අධ්‍යාපන සඳහා වූ පාසල් 30 ක් ද දිවයින පුරා විසිරී පවතී. දිවයින පුරා පිහිටි පාසල් 11,091 හි සිසු දරුවන් මිලියන 4.3 ක් පමණ අධ්‍යාපනය හදාරණ අතර 270,000 ක් පමණ ගුරුවරුන් විවිධ විෂයධාරා යටතේ අධ්‍යාපනය ලබා දෙයි.

වසරකට 320,000 ක් පමණ සිසුන් පළමු ශ්‍රේණිය සඳහා අතුළත් වන අතර ප්‍රාථමික අධ්‍යාපනය අවසන් වන විට ඉන් 2% පමණ පාසල් හැර යන අතර අ.පො.ස. සා. පෙ. විභාගය පනී සිටින්නේ ඉන් 98% ක් පමණ වේ. මේ අතරින්ද උසස් පෙළ විභාගය සමත්ව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන්නේ උසස් පෙළ සමත් සිසුන් අතරින් සියයට 23 ක් පමණක් රාජ්‍ය විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ අධ්‍යාපනය ලබයි. එබැවින්, විවිධ අවස්ථා වලදී පාසලින් ඉවත්වන දරුවන්ගේ කුසලතා වර්ධනය කරමින් රැකියා වෙළඳපොල තුළ අවස්ථාවක් ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණු සහ නිපුණතා අංශයත්, නොවිධිමත් අධ්‍යාපන අංශයත් විවිධ පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි.

උසස් අධ්‍යාපන අංශයෙහි ආයෝජනය තුළින් රටට අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කර ගත හැකි බැවින් නව විශ්ව විද්‍යාල ස්ථාපිත කිරීම සහ නව පීඨ හඳුන්වා දීම ඔස්සේ විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම රජයේ අපේක්ෂාවයි. ඒ සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාල 17 ක් සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 23 ක් පමණ දිවයින පුරා විහිදී පවතී. දිස්ත්‍රික් කෝටා ක්‍රමවේදය (District Quota System) පදනම් කර ගනිමින් වාණිජ්‍ය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ තාක්ෂණ විෂය ධාරා සඳහා ද සමස්ථ කුසලතා පදනම මත කලා විෂය ධාරාව සඳහා ද සිසුන් තෝරා ගනු ලබන අතර 2021 වසරේ දී සිසුන් 44,000 කට පමණ විශ්ව විද්‍යාල ප්‍රවේශය හිමි විය. විද්‍යා සහ තාක්ෂණ විෂය ධාරා යටතේ වැඩි සිසුන් සංඛ්‍යාවක් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා සපයා දීම තුළින් රැකියා වෙළඳපොලට ගැලපෙන උපාධිධාරීන් බිහි කිරීම රජයේ අභිප්‍රායයි. මීට අමතරව, රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය සහන පොළී අනුපාත යටතේ ලබා දෙන අතර 2021 වසරේ දී සිසුන් 4,660 කට පමණ ශිෂ්‍ය වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සූදානම් කර ඇත. විශ්ව විද්‍යාල අධ්‍යාපනයට අමතරව රටපුරා විහිද පවතින අධ්‍යාපන විද්‍යාපීඨ 19 ක ගුරු සිසුන් 4,500 ක් සඳහා අධ්‍යාපනය අවස්ථා ලබා දෙනු ලබයි.

### ප්‍රධාන වැඩසටහන් සහ ව්‍යාපෘති

### සාමාන්‍ය අධ්‍යාපන අංශය

- පාසල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා නංවාලීම සහ පාසල් පැමිණීම වර්ධනය කිරිම සඳහා ක්‍රියාත්මක කරනු ලබන පාසල් දිවා ආහාර වැඩසටහන
- ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
- ද්විතීක පාසල් වල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ජාතික පාසල් 1,000 ක් ස්ථාපිත කිරීම

- තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය
- ප්‍රාථමික පාසල් වල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
- වතු ආශ්‍රිත පාසල් වැඩි දියුණු කිරීමේ වැඩසටහන
- පාසල් දරුවන් සඳහා වන විවිධ සුභ සාධන වැඩසටහන්

**උස්ස අධ්‍යාපන අංශය**

- විශ්ව විද්‍යාලවල තාක්ෂණික පීඨ ස්ථාපනය කිරීම
- සබරගමුව සහ මොරටුව විශ්ව විද්‍යාලයේ නව වෛද්‍ය පීඨ ස්ථාපනය කිරීම
- රුහුණ විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨය ස්ථාපනය කිරීම
- උසස් අධ්‍යාපන කඩිනම් කිරීමේ හා සංවර්ධනය කිරීමමේ ව්‍යාපෘතිය
- වයඹ විශ්ව විද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය
- විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

2022.12.31 වන විට ප්‍රගතිය

| අයිතමය | ලැබුණු ගණන | නිර්දේශ ඉදිරිපත් කළ ගණන |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | 17 | 17 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන | 24 | 24 |

**නිපුණතා අධ්‍යාපනය**

ශ්‍රී ලංකාව වැනි වර්ධනය වන ආර්ථිකයන්හි තරුණ තරුණියන්ට කාර්මික අංශ සමඟ සම්බන්ධ වී
කටයුතු කිරීමට මෙන්ම නිපුණතා හිඩැස පිරවීම සඳහා නිපුණතා ලබා ගැනීමට ද හොඳ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET) පද්ධතියක් තිබිය යුතුය. ඒ අනුව, රට තුළ ජාතික, ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාවලියේදී ඉහළ නිපුණතා සහ නිපුණ ශ්‍රම බලකායක් සිටීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. ඊට සමගාමීව, ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමත්, අපනයනය ඉලක්ක කරගත් කර්මාන්තවලට සහාය වීමත්, හරිත ආර්ථිකයක් වෙත රට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීමත් අරමුණු කර ගනිමින් තරුණ හා වැඩිහිටියන් සඳහා නිපුණතා, ප්‍රති-නිපුණතා සහ ඉහළ නිපුණතා සඳහා වෘත්තීය-තාක්ෂණික සහ ඩිජිටල් කුසලතා වර්ධනය කිරීමටත්, රජය කටයුතු කර ඇත.

**නිම කරන ලද කාර්යයන්**

- නිසියාකාරව සාධාරණීය කර ඇති ඇගයීම් වාර්තා 09 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 07ක් සඳහා නිරීක්ෂණ සකස්කිරීම.

- නිපුණතා සංවර්ධන අංශයට අදාළව අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.
- විවිධ පාර්ශ්ව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස්/නිරීක්ෂණ සකස්කිරීම

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

විසි එක්වන සියවස දැනුම කේන්ද්‍රීය වූ සියවසක් ලෙසින් හඳුන්වනු ලබයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය වනුයේ තාක්ෂණය පදනම් කරගත් සමාජයක් බිහි කිරීම වන අතර එය ගෝලීය නව්‍යකරණ කේන්ද්‍රය, ජනතාව කේන්ද්‍ර කරගත් ඩිජිටල් රාජ්‍ය තන්ත්‍රයක් බිහි කිරීම, ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් බිහි කිරීම සහ තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් බිහි කිරීම තුළින් ගොඩ නැගීමට අපේක්ෂා කරනු ලබයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නව තාක්‍ෂණයන් සඳහා උපායමාර්ගිකව ආයෝජනය කිරීම හා එවැනි නවෝත්පාදනයන් අපේ අධ්‍යාපන ක්‍රමය සහ ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීම කාලීනව අවශ්‍ය වේ. "ජාතික ඩිජිටල් පරිවර්තන න්‍යායපත්‍රය", තාක්ෂණික හා සංවර්ධන අංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල කාර්යභාර්යයක් ඉටු කිරීම සඳහා පාර්ශ්වකරුවන්ට හිතරක පරිසරයක් නිර්මාණය කරනු ලබයි. නව තාක්ෂණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කරමින් අපනයන ආදායම ඉහළ නැංවීමට සහ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය ලෝකයේ නැගී එන ගමනාන්තයක් ලෙස වැඩිදියුණු කිරීම රජයේ අරමුණයි. 2022 දී, රටේ ඩිජිටල් සංවර්ධනයට තුඩු දෙන ප්‍රධාන කෙටි කාලීන සහ මධ්‍ය කාලීන මුලපිරීම ඉස්මතු කරමින් ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් "ප්‍රතිසාධනය සහ වර්ධනය සඳහා ඩිජිටල් ඇතුළත් කිරීම සහ පරිවර්තනය" සඳහා ප්‍රතිපත්ති පත්‍රිකාවක් සකස් කරන ලදී.

### නිම කරන ලද කාර්යයන්

- අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් සංවිධානය කිරීම.

## සමාජ ආරක්ෂණ අංශය

සමාජයේ ජීවත්වන වන වරප්‍රසාද නොලත් අත්‍යවශ්‍ය සියලුම ජන කොටස් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින් සහ සවිබල ගැන්වීම් මඟින් රටේ සංවර්ධන ප්‍රවේශයට අනුගත කිරීම සඳහා ඉලක්ක කර ගත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම රැසක් රජය ක්‍රියාත්මක කරනු ලබයි. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය පසුකාලීනව කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය ළමයි, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළුව අවදානමට ලක්විය හැකි කොටස් වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ. ඒ අනුව මෙම කණ්ඩායම්වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහ ඔවුන් සමාජයට ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ සමඟ අවශ්‍ය මැදිහත්වීම් සිදු කරයි.

**2022.12.31** දිනට ප්‍රගතිය

- ව්‍යාපෘති යෝජනා සඳහා ඇගයුම් වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකා වෙත නිරීක්ෂණ සකස් කිරීම

| | ලැබුණු සංඛ්‍යාව | නිර්දේශිත/ ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | - | - |
| කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ | 01 | 01 |
| කැබිනට් සංදේශය සඳහා අදහස් | 07 | 07 |

- **නිර්දේශ ඉදිරිපත් කිරීම -** ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය , සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) ප්‍රතිව්‍යුහගත කිරීම (Restructure) සහ මුල් ළමාවිය සංවර්ධන (ECD) වැඩසටහන නැවත සැකසීම (Repurpose) සඳහා නිර්දේශ ලබා දෙන ලදී.

- **ප්‍රතිපත්ති සමාලෝචනය සහ ඇගයීම - පහත ප්‍රතිපත්ති සමාලෝචනය කර නිරීක්ෂණ ලබා දෙන ලදී.**
  - ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
  - අධ්‍යාපන ප්‍රතිපත්තිය
  - ජාතික සමාජ ආරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව

- **පහත වාර්තා පිළිබඳ අදහස් ලබා දෙන ලදී.**

  - කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත
  - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමාජගත කිරීමේ දැනුම ඇති කිරීම
  - 2023, UPR හි 4 වන චක්‍රය
  - ළමා ආරක්ෂාව සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම

- **රැස්වීම් සහ වැඩමුළු වලදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කරයි -**

- සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් සපයන ලදී.

## 2.6 රාජ්‍ය කළමනාකරණය සහ පාලනය, සංස්කෘතික හා ආගමික කටයුතු සහ සාර්ව ආර්ථික සංවර්ධනය

**යහ පාලන අංශය**

2022 වර්ෂයේ දී යහ පාලන අංශය විසින් මෙරට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හා නීතිය ක්‍රියාත්මක වන සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම පිණිස රජයේ ජාතික ආර්ථික ප්‍රතිපත්තිය මඟින් ප්‍රකාශිත අරමුණ හා ක්‍රමෝපායන් හා පදනම්ව වැදගත් කාර්යභාරයක් ඉටු කොට ඇත.

තවද, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමේ දී මෙන්ම මධ්‍යකාලීන අයවැය රාමුව සකස් කිරීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම අරමුණු කොට ක්‍රියාත්මක වී ඇත. එසේම නව තාක්ෂණය සබැඳි මහජන මිත්‍රශීලී රාජ්‍ය සේවයක් ගොඩනැගීම, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සුරැකීම, මිත්‍රශීලි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, වංචාවෙන් හා දූෂණයෙන් තොර රටක් බිහි කිරීම, හා රාජ්‍ය සේවය තුළ වගවීම තහවුරු කිරීම අරමුණු කොට පහත සඳහන් රාජ්‍ය අමාත්‍යාංශ හා අනෙකුත් ව්‍යුහයන්ට අදාල ක්ෂේත්‍රයන් හි ක්‍රමසම්පාදන ක්‍රියාවලියට දායකවී ඇත.

  - රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන
  - මහජන ආරක්ෂාව
  - ජාතික ආරක්ෂාව
  - ජනමාධ්‍ය
  - අධිකරණ
- විදේශ කටයුතු
- ආගමික, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන්
- ස්වාධීන කොමිෂන් සභා හා විශේෂ වියදම් ඒකක

ඒ අනුව, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය කළමනාකරණයක් උදෙසා යටතේ 2022 වර්ෂයේදී,

- රජයේ අරමුදල හෝ විදේශ අරමුදල මඟින් මූල්‍යයන කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 74 ඇගයීමට ලක් කිරීම.
- විවිධ අමාත්‍යාංශ යටතේ ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 40 සඳහා නිරීක්ෂණ හා විචාර ලබා දීම.
- අංශයේ විෂය පථය යටතේ මෙහෙයුම් කමිටු ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සහ සහභාගී වීම.
- ආර්ථික සංවර්ධනය සඳහා හිතෛෂී පරිසරයක් සකස්කිරිම හා කාර්යක්ෂම මහජන සේවයක් තහවුරු කිරීමට යහ පාලන යටතේ වූ රාජ්‍ය ආයතන යොමුකිරිම සඳහා අමාත්‍යාය මණ්ඩලය විසින් පත් කල කමිටුවක් ඇතුළුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු 09 ක් හා ප්‍රතිපත්ති සැකසීමේ හා සමාලෝචනය කිරීමේ කමිටු 02ක් සඳහා දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය නියෝජනය කරමින් එම රැස්වීම් වලට සහභාගි වීම.

**සාර්ව ආර්ථික අංශය**

සාර්ව ආර්ථික අංශය අප දෙපාර්තමේන්තුව තුල පවතින අනෙකුත් සියලුම සංවර්ධන අංශයන් තනි ප්‍රතිපත්ති රාමුවක් මගින් ඒකාබද්ධ කරමින් රටේ පොදු සංවර්ධන ඉලක්කය වෙත

සමස්තයක් ලෙස මෙහෙයවනු ලබන අංශයයි. ඒ අනුව සාර්ව ආර්ථික අංශයේ ධාරිතාව සංවර්ධනය කෙරෙහි 2022 වර්ෂයේදී වැඩි අවධානයක් යොමුවන ලද අතර ඒ සම්බන්ධයෙන් ලෝක බැංකු නියෝජිතයන් සමග සාකච්ඡා කිහිපයක්ද පවත්වන ලදී. තවද, අග්‍රාමාත්‍ය තුමාගේ අනුග්‍රහය පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් තුමන්ගේ අධීක්ෂණය යටතේ "ජාතික ප්‍රතිපත්ති උපදේශන කමිටුවක්" ස්ථාපනය කරන ලදී. මෙම කමිටුව අප අධ්‍යක්ෂ ජනරළ තුමන් ඇතුළුව, IPS ආයතනයේ විධායක අධ්‍යක්ෂතුමියගෙන් සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආර්ථික උපදේශකවරයෙකුගෙන්ද සැදුම් ලද අතර විධිමත් ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය.

ඒ අනුව, පවතින ආර්ථික අර්බුදය හමුවේ සර්ව ආර්ථික අංශය 2022 වසර සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරන ලදී:

- පිහිටුවන ලද "ජාතික ආර්ථික උපදේශන කමිටුව" මගින් ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක් කෙටුම්පත් කරන ලද අතර එහි “මූලික වාර්තාව” අග්‍රාමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි “ආර්ථික ස්ථායිකරණ කමිටුව” වෙත ඉදිරිපත් කිරීම.
- එක් කැබිනට් පත්‍රිකාවක් සඳහා 2022 වසරේදී මෙම අංශය මගින් නිරීක්ෂණ ලබාදෙන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියක් ඇගයීමෙන් පසු නිර්දේශ ලබාදීම.
- මෙම අංශය හා සම්බන්ධ ලෝක බැංකු විදේශ ධූත සංචාර 15ක්, ප්‍රංශ ධූත සංචාර 01ක් සහ ආසියානු සංවර්ධන බැංකු ධූත සංචාර 02ක් සඳහා 2022 වසරේදී අප අංශය මගින් අනුමැතිය ලබාදීම.
- ආසියානු සංවර්ධන බැංකුව මගින් ආධාර ලබාගැනීම සඳහා වන ව්‍යපෘති මාලාව සඳහා අප දෙපාර්තමේන්තුවේ අදාල අංශයන්ගෙන් තෝරාගත් සුදුසු ව්‍යාපෘති විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- මේ වනවිට සම්පාදනය කෙරෙමින් පවතින රාජ්‍ය මුදල් කළමනාකරණ පනත සඳහා සාර්ව ආර්ථික ප්‍රස්තුතයන්ට අනුකූල නිර්දේශ ලබාදීම.

## 2.7 ශ්‍රමික කටයුතු

**ශ්‍රමික අංශය**

**ශ්‍රම ඵලදායකත්වය ඉහළ නැංවීම**

භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපොළට ගෙන ඒම සඳහා පුද්ගලයෙකු විසින් කායික හා මානසික වශයෙන් දරන උත්සාහය නොහොත් ශ්‍රමය, නිෂ්පාදනයේ ඉතාම වැදගත් සාධකයක් වේ. ශ්‍රමය පිළිබඳ සැලකීමේදී, පුද්ගලයාගේ කුසලතා මට්ටම, අධ්‍යාපනය සහ ඵලදායිතාව කෙරෙහි ඇති උනන්දුව ඇඳහිය නොහැකි තරම් වැදගත් අංග වේ. එබැවින් ආරථිකයේ සමස්ත ඵලදායිතාව ශ්‍රමයේ ගුනාත්මකභාවය මත රදා පවති. ඒ අනුව වත්මන් ප්‍රතිපත්ති රාමුව මගින් ‘‘ඵලදායි පුරවැසියෙක් සශ්‍රීක මානව සම්පතක්’’ ප්‍රතිපත්තිය තුළ කුසලතාවෙන් හෙබි ඵලදායි ශ්‍රම බළකායක් බිහිකිරීම ප්‍රධාන අරමුණක් වේ. ආර්ථිකයේ සීඝ්‍රවත් වර්ධනයක් අත්කර ගැනීමට හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය, දැනුම සහ කුසලතාව පදනම් කරගත් ශ්‍රම බලකායක් අප රට තුල ස්ථාපිත කළ යුතුය. එමෙන්ම රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදය හමුවේ කඩිනම් සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා පුහුණු, ක්‍රියාශීලී ශ්‍රම දායකත්වයක් කර්මාන්ත හා සෙවා අංශ කෙරෙහි යෙදවීම අත්‍යවශ්‍ය

සාධකයක් වෙයි. තවද තාක්ෂණය, දැනුම සහ කුසලතාවලින් පිරිපුන් ශ්‍රමිකයන් රැකියා සඳහා විදෙස්ගත කිරීම තුළින් පවතින ආර්ථික අර්බුදයට සාධනීය පිළියමක් ලබා ගැනීමට හැකිවනු ඇත. මේ තුළින් විදේශ විනිමය අර්බුදය සඳහා කෙටි කාලීන විසඳුමක් සැපයෙන අතර දීර්ඝ කාලීනව ඉහළ අතිදැකීම් සහ ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන් සමන්විත දක්ෂ ශ්‍රම බලකායක් මෙරට වර්ධනය වේ. 2020 දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වටිනාකම රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 7.1%ක් පමණ ඉහළ අගයක් විය. එහෙත් මේවන විට සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහල යැමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බැවින් එම ප්‍රේෂණ වර්ධනය කර ගැනීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ශ්‍රමික අංශය කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සලකා බලමින් නිරීක්ෂණ ලබාදීම හා ප්‍රතිපත්ති යෝජනා ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව 2022 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදි.

- ව්‍යාපෘති යෝජනාවක් ඇගයීම් කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 9ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම. ඒ අතර රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජතික ප්‍රතිපත්තිය සහ වර්ෂ 2023 – 2026 කාලසීමාව සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ද ඇතුලත් වේ.
- සංවර්ධනය සහ සහයෝගීතාව සඳහා ස්විට්සර්ලන්ත නියෝජිතායතනයේ සහය ඇතිව මුදල් අමාත්‍යාංශය සහ ILO අතර ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස විදෙස් රැකියා විගමනිකයන් සඳහා හදිසි ඉවත් කිරීමේ ප්‍රතිචාර සැලැස්මක් සකස් කිරීමට සහයෝගය ලබා දෙමින් සිටි
- තමන් ලද වෘත්තීය පුහුණුවට උපාධියට හෝ දැනුමට සරිලන විදේශ රැකියාවක් සොයාගැනීම සඳහා වෘත්තීය පුහුණු ආයතන, විදේශ රැකියා නියෝජිත ආයතන, විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සහ තානාපති කාර්යාල ඒකාබද්ධව පරිසණක ජාලයක් ඇතිකිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී. මේ සඳහා අවශ්‍ය සහය මෙහෙයුම් කමිටුවක් හරහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබයි.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර විගමනික සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන සේවකයාගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතිකකිරීම සහ සුනිසි (Decent) වැඩ පරිසරයක් සෑදීම ආදී වැඩ සටහන් සඳහා අවශ්‍ය සහය ලබා දී ඇත.
- අපදා අවස්ථාවන්හිදී විගමනික ශ්‍රමිකයන් නැවත ගෙන්වා ගැනීම සම්බන්ධ නෛතික මාර්ගොපදේශයන් සහ නීති සකස් කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය සමග එක්ව කාර්මික සහය ලබා දෙන ලදී.

## 2.8 තරුණ, ක්‍රීඩා කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධනය

### තරුණ කටයුතු අංශය

තරුණයන්ගේ අභිලාෂයන් නිවැරදිව හඳුනා ගනිමින් රටේ සංවර්ධන අරමුණු සමඟ එය ගලපාලමින් ඔවුන්ව එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් යටතේ

මාර්ගෝපදේශ ලබාදෙමින් මෙහෙයවීම ප්‍රධාන අරමුණ වේ. තවද ආර්ථික ක්ෂේත්‍රය තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරිම අවස්ථා සලසා දීම සඳහා අවශ්‍ය දිරි ගැන්වීම් ක්‍රියාත්මක කිරීම සහ තරුණ සහභාගීත්වය රටේ අධ්‍යාපන, සමාජ, දේශපාලන ක්ෂේත්‍ර තුළ තහවුරු කිරීමට අවශ්‍ය පසුබිම සැළසීමද සිදු කරනු ලබයි.

**ක්‍රීඩා අංශය**

නිපුණතා සපිරි, නීරෝගීමත් විනයගරුක මානව සම්පතක් බිහි කිරීම සඳහා ක්‍රීඩා සංස්කෘතියක් සමාජය තුළ ස්ථාපනය කිරීම ප්‍රධාන කොට අරමුණු කර ඇත. එහිදී, පාසල් මට්ටමේ සිට දරුවන් ක්‍රීඩාශීලීත්වයට හුරු කිරීම, විශේෂ ක්‍රීඩා කෞෂල්‍යයන්ගෙන් යුත් දරුවන් හඳුනාගෙන ඔවුන් ජාත්‍යන්තරය දක්වා ගෙන යාම, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා උපදේශකයන්ගේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම අපේක්ෂා කෙරේ.

ගෝලීය කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ රටතුළ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් රාජ්‍ය වියදම් පාලනය සහ නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නැවැත්වීම වැනි ක්‍රියාමාර්ග හේතුවෙන් ක්‍රීඩා හා තරුණ කටයුතු අංශයට ව්‍යාපෘති යෝජනා 05 ක් පමණක් ලැබුණු අතර, එම යෝජනා ඇගයීමට ලක් කර අවශ්‍ය නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත ලබා දෙන ලදි. තවද, රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 06 ක් සඳහා මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදි.

**ප්‍රාදේශිය සංවර්ධන අංශය**

දිළිඳුකම පිටුදැකීමටත්, පවත්නා ප්‍රාදේශිය විෂමතාවන් අවම කරමින්, ප්‍රදේශයේ පවත්නා සුවිශේෂතාවන් හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා, අංශයට අදාළ ප්‍රතිපත්තිමය කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් (policy inputs) ලබා දීම සිදුකරයි. තවද, ආංශික හා මධ්‍යකාලීන සැලසුම් සැකසීම, ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘති පෙළ ගැස්ම සැකසීම ආදී කටයුතු ද ඉටු කරනු ලබයි.

ප්‍රාදේශීය සංවර්ධනයේදී, ගම හුදකලා කර සංවර්ධනය කරනවා වෙනුවට ගම සමග ප්‍රදේශ සම්බන්ධ කර කලාපයක් ලෙස සංවර්ධනය කිරීමත්, එලෙස සංවර්ධනය වූ කලාප අගනගර හා සම්බන්ධ කළ යුතු බව වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති තුළින් අවධාරණය කර ඇත. ඒ අනුව, ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා, ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනීමේ වැදගත්කම මෙම අංශය මගින් අවධාරණය කෙරේ.

සියළුම පළාත් සභාවන් සඳහා, මුදල් කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී මෙම අංශය විසින් අදාළ යෙදවුම්/නිරීක්ෂණ ලබා දෙන ලදි.

## 2.9. ප්‍රාදේශීය සංවර්ධන අංශය

### 01. Promoting Autonomy, Literacy and Attentiveness through Market Alliances (PALAM/A) Project in Sri Lanka

මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර ලෙස මෙරටට ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ වෙළඳ බද්ද ගෙවීම වෙනුවෙන් හා ආහාර ද්‍රව්‍ය වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා 2022 අයවැය යටතේ පහත පරිදි ප්‍රතිපාදන වෙන් වූ අතර ඊට අතිරේකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගත් අතර 2022.12.31 දිනට වියදම පහත වාර්තා කර ඇත.

| වැය ශීර්ෂය | 2022 අයවැය මගින් වෙන්කළ ප්‍රතිපාදන රු. | අතිරේකව ලබා ගත් ප්‍රතිපාදන රු. | මුළු ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 237-1-2-4-2506 (13) | 80,000,000.00 | 1,576,065,876.00 | 1,656,065,876.00 | 1,656,065,876.21 |
| 237-1-2-4-2506 (17) | 6,000,000.00 | 8,200,000.00 | 14,200,000.00 | 14,185,300.00 |

## 2.10 ලෝක ආහාර වැඩසටහන (WFP)

ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාවය විධිමත් ලෙස ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත්තේ 1968 නොවැම්බර් මස 10 වන දින මූලික ගිවිසුමකට අත්සන් කිරීමෙන් වන අතර ශ්‍රී ලංකා රජය එහි ක්‍රියාකාරකම් ඉටු කිරීමට කැපවී ඇත. ලෝක ආහාර වැඩසටහන අදියර කිහිපයක මැදිහත්වීම මගින් සහාය දක්වන්නේ හදිසි අවස්ථාවන්ට සූදානම්වීම සහ ප්‍රතිචාර දැක්වීම පාසල් ආහාර වැඩසටහන, මව්වරුන්ගේ මන්දපෝෂණීය තත්ත්වයන් වැලැක්වීම හා කළමනාකරණය කිරීම, දේශගුණික වෙනස්වීම් නිසා ඇතිවන කම්පන වලින් යථා තත්ත්වයට පත් කිරීම, ජීවනෝපාය නැංවීමට සහාය ලබාදීම, ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම වැනි ක්‍රියාකාරකම් ඉටු කිරීමෙනි. වර්තමානයේ 2018 සිට 2022 දක්වා රාජ්‍ය උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන වශයෙන් තිරසර සංවර්ධන අරමුණුවල අංක 02 හි සඳහන් කුසගින්න තුරන්කිරීමේ අරමුණුවලට අනුගත වෙමිනි. පහත දැක්වෙන නිමවුම් අපේක්ෂිත ප්‍රතිඵල වේ.

- ශ්‍රී ලංකාවේ කාලගුණික හා වෙනත් අර්බුද වලින් පීඩාවට පත්වන ජනතාව වෙත වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය
- ආහාර අනාරක්ෂිත ප්‍රදේශවල සිටින පාසල් යන වයසේ දරුවන්ට වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය
- ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු දරුවන්ගේ, නව යොවුන්වියේ ගැහැනු දරුවන්ගේ සහ සඵල වයසේ කාන්තාවන්ගේ පෝෂණය 2025 වන විට වැඩිදියුණු කිරීම
- ශ්‍රී ලංකාවේ අවධානමට ලක්විය හැකි කණ්ඩායම්වල සහ සුළු පරිමාණ ගොවීන්ගේ වසර පුරා ජීවනෝපාය සහ කම්පන වලට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම

ඉහත ප්‍රතිඵල ළඟා කරගැනීම සඳහා 2018-2022 රාජ්‍ය උපාය මාර්ගික සැලැස්ම වාර්ෂික සැලසුම් යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මගින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පහත ක්‍රියාකාරකම් 2022 වසර තුළ ක්‍රියාත්මක කර ඇත.

## 1. ශ්‍රී ලංකාවේ අර්බුදවලින් පීඩාවට පත් ජනතාවට වසර පුරා ආහාර ලැබීම සඳහා ප්‍රවේශය

ආර්ථික, සාමාජීය, පාරසරික, දේශගුණික සහ වෙනත් කම්පනවල ප්‍රතිඵලයක් ලෙස බොහෝ අවධානමට ලක්විය හැකි ප්‍රජාවන් ආහාර හා පෝෂණ අනාරක්ෂිතභාවයේ අවධානමට ලක්ව ඇති අතර ප්‍රමාණවත් වගාකිරීමේ හැකියාවක් නොමැති නිසා එම තත්ත්වය උග්‍ර වේ.

ලෝක ආහාර වැඩසටහනේ හදිසි සහන මැදිහත්වීම් ආපදා අවස්ථාවලදී හා යථාතත්ත්වයට පත් කරන මූලික අවධියේදී ඉහත අවධානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහය ලබාදීම තක්සේරු කරන කරුණු මත සහතික වනු ඇත. මෙම ප්‍රතිඵලය අර්බුදකාරී අවස්ථාවලදී ආහාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන, බලපෑමට ලක්වූ කණ්ඩායම් විශේෂයෙන් ළමයින්, කාන්තාවන් සහ ඔවුන්ගේ නිවාස ප්‍රධානීන් වැඩිහිටියන් හා ආබාධ සහිත පුද්ගලයින් සහ අඩු ආදායම්ලාභී පවුල් ප්‍රමාණවත් පෝෂ්‍යදායී ආහාර පරිභෝජනය කිරීම සහතික කරයි. මෙම ප්‍රතිඵලයේ මූලික අවධානය යොමුවූයේ ආපදාවලින් පීඩාවට පත් ජනතාවට මානුෂික ආධාර ලබාදීම සහතික කිරීමයි.

පීඩාවට පත් ජනතාවට පෝෂණීය අවශ්‍යතා හා මූලික ආහාර ලබාදීම මගින් කඩිනමින් ආහාර වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබාදීම මෙහි ප්‍රධාන නිමවුම වේ. මේ යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

i. වැඩි අවධානමට ලක්විය හැකි පවුල් මුහුණ දෙන වර්තමාන ආර්ථික අර්බුදය සැලකිල්ලට ගෙන ලෝක ආහාර වැඩසටහන දිස්ත්‍රික්ක 14 ක ජීවත්වන අවධානමට ලක්විය හැකි පවුල් සඳහා ආධාර ලබාදී ඇත. නිර්නායක භාවිතාකර තෝරාගත් පවුල් වෙත මුදල් හෝ ආහාර ලෙස ආධාර ලබා දෙන ලදී. ඒ අනුව අම්පාර, කොළඹ, ගාල්ල, යාපනය, නුවර එළිය, මන්නාරම, මොණරාගල සහ මුලතිව් යන දිස්ත්‍රික්ක 8 ක අවධානමට ලක් වූ පවුල් සඳහා මුදල් ආධාර ලබා දෙන ලදී. වෙස්ටර්න් යූනියන් බැංකුව හරහා මෙන්ම ජ්ල්ග් පේ ගිණුම් හුවමාරු ක්‍රමය මගින් ලෝක ආහාර වැඩසටහන සෘජුවම ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත මුදල් මාරුකරන ලදී. තෝරාගත් පවුලකට රු.15,000 බැගින් ලබාදුන් අතර ලෝක ආහාර වැඩසටහන විසින් වාර්තා කරන ලද මුළු වටිනාකම රුපියල් මිලියන 1,217.03 ක් වූ අතර ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව 81,135 කි. මීට අමතරව ලෝක ආහාර වැඩසටහන පවුල් 12,950 කට කාර්ගිල්ස් හරහා ආහාර වවුචර් බෙදාදී ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 194,253 ක් වැය කර ඇත.

ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව රුපියල් 625,625,000 ක් පවතින ආර්ථික අර්බුදයට ප්‍රතික්‍රියා දැක්වීමක් ලෙස අම්පාර, කොළඹ, ගාල්ල, යාපනය, නුවරඑළිය, මන්නාරම, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්ක වල ජීවත්වන ඉහළ බලපෑමට ලක්වූ අඩු අදායම්ලාභී පවුල් වෙත ආහාර ද්‍රව්‍ය කූඩයක් මිලදී ගැනීම සඳහා එක් පවුලකට රු. 15,000 ක් ලබා දෙන ලදී.

iii. අඩු ආදායම්ලාභී පවුල් 307,228 ක් සඳහා හදිසි ආහාර ආධාර ලෙස ආහාර ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 22,888.8 ක් (සහල් මෙට්‍රික් ටොන් 15,360, පරිප්පු මෙට්‍රික් ටොන් 6,144 ක් සහ එළවලු තෙල් මෙට්‍රික් ටොන්1,384 ක්) ලබාදීමට සැලසුම්කර තිබුණි. ප්‍රතිලාභීන් 52,571 ක් අතර ආහාර ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 3,919.2 ක් 2022 දෙසැම්බර් අවසන් වනවිට බෙදාහරින ලදී. එක නිවසකට සහල් කි.ග්‍රෑම් 50 ක්, පරිප්පු කි.ග්‍රෑම් 20 ක් හා එළවලු තෙල් කි.ග්‍රෑම් 4.5 ක් බැගින් ලබාදී ඇත. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මධ්‍යම ආහාර ගබඩාවල සිට විවිධ

සේවා සමුපකාරවලට අයත් ආහාර ගබඩා වෙත ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කරන ලදී. 2022 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ව්‍යාපෘතියට ලැබුන ආහාරවල වටිනාකම රුපියල් මිලියන 4,292.5 කි. රුපියල් මිලියන 15.6 ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූරණය කර ඇත. නිෂ්කාශනය, ප්‍රවාහනය සහ හැසිරවීමේ ගාස්තු ආවරණය කිරීම සඳහා රජයේ අරමුදල් වලින් රුපියල් මිලියන 103.24 ක් වැය කර ඇත.

iv. ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධස්ථානය, මෝසම් ප්‍රතිචාර සම්බන්ධීකරණ සංසදය පවත්වා ඔවුන්ගේ වාර්ෂික සැලැස්මේ ආපදා අවමකිරීමට සමගාමීව සහන සැලසුම් හා ප්‍රතිචාර, කාලීන තොරතුරු සහ කළමනාකරණය සහ ආහාර සුරක්ෂිතතා ක්‍රියාමාර්ග සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදී ඇත. ඒ අතරම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන මධස්ථානය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධස්ථානය එම ආයතන ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික ධාරිතාවය ප්‍රවර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මුළු වියදම රුපියල් මිලියන 18.98 ක් විය. එයට අතිරේකව, ලෝක ආහාර වැඩසටහන සෘජුවම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත Linux - ox සහිත බහු කාර්ය සේවර් එකක් ලබාදී ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 36. 31 කි.

v. ලෝක ආහාර වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා සහය වූ අතර ඒ යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ හදිසි මෙහෙයුම් මැදිරි 03 ක් ස්ථාපිත කරන ලදී. මුළු ආයෝජනය රුපියල් මිලියන 4.56 කි.

vi. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත රුපියල් මිලියන 04 ක් ලබාදෙන ලද්දේ තෙල් සහ රසායනික කාන්දුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ ජාතික වශයෙන් තෙල් සහ රසායනික කාන්දුවීමේදී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව අදාළ පාර්ශවයන් තුළ වැඩිදියුණු කිරීම සඳහායි. වියදම රු. මිලියන 3.85 කි.

vii. ලෝක ආහාර වැඩසටහන බහු මාධ්‍ය ප්රොජෙක්ටර් 02ක්, පරිගණක යන්ත්‍රයක්, UPS 02 ක්, අවසන් සැලසුම් දේශගුණික සේවා ව්‍යාපෘතිය යටතේ තොරතුරු පද්ධතිය ශක්තිමක් කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට සපයන ලදී. මුළු වියදම රුපියල් 600,000.00 කි.

viii. අවධානම් සංවේදී සැලසුම් සංවර්ධනය යටතේ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ තාක්ෂණික සහාය ඇතිව ලෝක ආහාර වැඩසටහන විසින් මඩකලපුව, යාපනය, මන්නාරම, මාතලේ සහ මොනරාගල දිස්ත්‍රික්ක 05 ක නිලධාරීන් 125 ක් සඳහා සෘජුවම GIS පුහුණුවීම් පවත්වා ඇති අතර දිස්ත්‍රික්කවල අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැප්ටොප් පරිගණක යන්ත්‍ර ලබා දී ඇත. පුහුණු හා පරිගණක සඳහා වූ මුළු ආයෝජනය රුපියල් මිලියන 19.61කී. ඊට අතිරේකව මඩකලපුව, යාපනය හා මන්නාරම යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර වියදම රුපියල් 361,000.00 කී.

## 2. ආහාර අනාරක්ෂිත ප්‍රදේශවල සිටින පාසල් වයසේ දරුවන්ට වසර පුරා අහාර සඳහා ප්‍රවේශය

පාසල් ආහාර වැඩසටහන වැදගත් ජාතික ආරක්ෂණ ජාලයක් වන බැවින් ඉහළ ආහාර අනාරක්ෂිත හා මන්දපෝෂණය සහිත ප්‍රදේශවල ඉලක්කගත පාසල් වයසේ දරුවන්ට වසර පුරා පාසල් ආහාර ලබා දීම සහතික කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන රජයට සහාය ලබා දී ඇත. මෙය කෙටිකාලීන කුසගින්න නිමා කිරීම, දරුවන් පාසලට පැමිණීම ඉහළ දැමීම සහ පාසල් වියේ දරුවන්ගේ ආහාර සුරක්ෂිතාවය සහ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා වන

ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ගවලට අනුකූලවන අතර සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සහ සාමය පවත්වා ගැනීම සඳහා රුකුලකි. ලෝක ආහාර වැඩසටහන ආහාර ආධාර හා තාක්ෂණික සහාය ලෙස ද්විත්ව ප්‍රවේශයක් භාවිතා කර අරමුණු සාක්ෂාත් කර ගනී. මෙම අකාරයේ ඒකාබද්ධ ප්‍රවේශ අධ්‍යාපන ආයෝජන ප්‍රතිලාභ උපරිම කිරීමට හා දිගුකාලීනව දරිද්‍රතාවය අඩුකිරීමට උපකාරී වේ. (අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික සහාය ඇතිව පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී)

සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ලද නිමවුම් 2ක් විය. ඒවා නම් ඉලක්ක ගත පාසල් වයසේ දරුවන්ට මූලික ආහාර හා පෝෂණ අවශ්‍යතා වඩා හොඳින් සපුරාලීම සඳහා ඔවුන් පාසල් යන සෑම දිනකම පෝෂ්‍යදායී ආහාරවේලක් ලබාදීම සහ ඉලක්කගත පාසල් යන වයසේ දරුවන්ට ඔවුන්ගේ මූලික ආහාර හා පෝෂණ අවශ්‍යතා සපුරාලීමට හැකිවන පරිදි වැඩිදියුණුකල පාසල් අහාර වැඩසටහනක් සැකසීම වේ. (අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික සහාය ඇතිව පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී)

**i.** නිවාස ආශ්‍රිත පාසල් දිවා ආහාර වැඩසටහන

සුළු පරිමාණ ගොවීන්ගේ නිෂ්පාදන මිළදී ගැනීම, පාසල් පෝෂණය ඒකාබද්ධ කිරීම, දේශිය ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරිම වැනි ධනාත්මක බලපෑම් මගින් හා දුගී බවේ විෂම චක්‍රය බිඳ දැමීම මගින් ඊළග පරපුරේ පෝෂණය සහ අධ්‍යාපනය සාර්ථකත්වය කරා මෙහයවිය හැකිය. දේශීය මිළදී ගැනීම් මගින් පාසල් ආහාරවලට සම්බන්ධ ඉල්ලුම ඉහළ දැමීම කළ හැකිය. දේශිය සුළු පරිමාණ ගොවියාගෙන් නිෂ්පාදන මිළදී ගැනීම් මගින් පාසල් පෝෂණයේ ප්‍රතිලාභ වැඩිදියුණු කළ හැකිය. නවෝත්පාදන අංගයක් වන නිවාස ආශ්‍රිත පාසල් ආහාර වැඩ සටහන සුළු පරිමාණ ගොවීන්ට පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර දේශීය වෙළඳපොළකට ඇතුළුවීමට සහාය වන අතර ඒකාබද්ධ ක්‍රියාවලියක් මගින් කෙරෙන එවැනි ඇතුළුවීම් මගින් උපරිම ප්‍රතිලාභ ළඟා කරදෙයි. දේශීය කෘෂිකර්ම නිෂ්පාදනය සහ සම්බන්ධිත පාසල් දිවා ආහාර වැඩසටහන, සුළු පරිමාණ ගොවීන්ට පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර දේශීය වෙළඳපලකට ඇතුළුවීමට සහයවන අතර ඒකාබද්ධ ක්‍රියාවලියක් මගින් කෙරෙන එවැනි ඇතුළුවීම් මගින් උපරිම ප්‍රතිලාභ ලබාදෙයි. දේශීය කෘෂිකර්ම නිෂ්පාදනය සහ සම්බන්ධිත පාසල් දිවා ආහාර වැඩසටහන, සුළු පරිමාණ ගොවීන්ට ව්‍යුහාත්මක හා පුරෝකථනය කළහැකි වෙළඳපලක් නිර්මාණය කිරීම මගින් වෙළඳපලකට සම්බන්ධ වීම පිළිබඳ ඔවුන්ගේ අවධානය අවම කළ හැකිය. නිවාස පාදක පාසල් ආහාර වැඩසටහනේ ඉහළම ඉලක්කය වන්නේ ප්‍රාථමික පාසල් දරුවන්ගේ අධ්‍යාපනික ප්‍රතිඵල සහ පෝෂණය ඉහළ නැංවීම සඳහා සුදුසු සුළු පරිමාණ ගොවීන් සමග තිරසාර සම්බන්ධීකරණය සහිතව පාසල් ආහාර වැඩසටහන දියුණු කිරීමයි. ඒ අනුව තණමල්විල හා විල්ගමුව අධ්‍යාපන කලාප වල පිහිටි පාසල් 10 ක සහන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

අ. භෝජනශාලා ඉදිකිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව අධ්‍යාපන කලාපයේ භෝජනාගාර 05 ක සිවිලිම් ඉදිකිරීම සහ මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල අධ්‍යාපන කලාපයේ භෝජනශාලා 05 ක් සඳහා උපකරණ සැපයීම මගින් 2021 වසරේ ඉතිරිවූ වැඩකටයුතු අවසන් කරන ලදී. මුළු ආයෝජනය රු. මි. 9.93 කි.

ආ. මුදල් කළමනාකරණය සහ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ පුහුණුව

මෙම ව්‍යාපෘතිය අනුරාධපුර, මඩකලපුව, පොළොන්නරුව සහ වවුනියාව යන දිස්ත්‍රික්ක 04 ට ව්‍යාප්ත කළ බැවින්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි විවිධ ආයතන

වල තෝරාගත් රාජ්‍ය නිලධාරීන් 250 දෙනෙකු සඳහා මුදල් කළමනාකරණය සහ අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ පුහුණු කිරීම් කරන ලදී. මීට අමතරව, 2023 වසරේ කුකුළු ගොවිපලවල් ස්ථාපනය කිරීම සඳහා හා නිවාස පාදක පාසල් දිවා ආහාර වැඩසටහන පිළිබඳව පුහුණුකරුවන් පුහුණුකිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින්, දිස්ත්‍රික්ක 04 තුළ පවත්වා ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හා ලෝක ආහාර වැඩපිළිවෙල විසින් වාර්තාකරණ මුළු ආයෝජනය රු. මි. 3.99 කි.

ii. ආහාර වේලෙහි පිරිවැය සකස් කිරීම සඳහා පුහුණුව

අධ්‍යාපන අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ආහාර කැලරි ගණනය කිරීම පිළිබඳ පුහුණු කරන ලදී. වැඩසටහන මෙහෙයවනු ලැබුවේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසිනි. වියදම රු. 247,658.00 කි.

iii. පාසල් ආහාර වැඩසටහන සඳහා ටින් මාළු බෙදා හැරීම

පාසල් ආහාර වැඩසටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් සඳහා ටින් මාළු මෙට්‍රික් ටොන් 28.5 ක් බෙදා දෙන ලදී. වාර්තාගත වටිනාකම රු. මි.  6.04 ක් වූ අතර කළුතර දිස්ත්‍රික්කයේ පාසල් වලට ටින් මාළු බෙදා හැරීමට හා ලෝක ආහාර සටහන සහාය වී ඇත.

iv. පාසල් ආහාර සඳහා සහල් බෙදාදීමේ වැඩසටහන

ලෝක ආහාර වැඩසටහන පාසල් ආහාර වැඩසටහන සඳහා සහල් මෙට්‍රික් ටොන් 1,470.5 ක් පරිත්‍යාග කර ඇත. පළාත් 09 ක දිස්ත්‍රික්ක 25 ක පිහිටි පාසල් 7,685 ක් අතර සහල් තොගය බෙදාදුන් අතර ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 1,053,042 ක් විය. (බාලිකා 529,830, බාලක 523,212). අධ්‍යාපන අමාත්‍යාංශය ආහාර බෙදා දෙන ලදී.

## 3. ශ්‍රී ලංකාවේ අවධානමට ලක් විය හැකි කණ්ඩායම් වල සහ සුලු පරිමාණ ගොවීන්ගේ වසර පුරා ජීවනෝපාය සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම

රජයේ ප්‍රමුඛතාව වන්නේ අර්බුදකාරී අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමට අමතරව අවධානමට ලක් විය හැකි කණ්ඩායම් තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ ජීවනෝපායන් ශක්තිමත් කිරීම වන අතර ශක්තිමත් කරන ලද පද්ධති සහ ක්‍රියාවලීන් මගින් ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීමයි. මෙම ප්‍රතිඵලය තුළින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සහ පුද්ගලයන් කම්පනවලට මුහුණ දීම සඳහා සවිබල ගැන්වීම මඟින් ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය වැඩි දියුණු කිරීම සිදු කරයි. එය ආහාර ආධාර ජීවනෝපාය ආධාර හා රජයේ ධාරිතාව ශක්තිමත් කිරීම මඟින් ප්‍රජාවන්ට කල්පවත්නා විසඳුම් ලබා දෙයි. රාජ්‍ය ධාරිතාවය ශක්තිමත් කරන්නේ ව්‍යුහාත්මක සහ සමාජ සංස්කෘතික අසමානතා සමනය කිරීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් අවධානම් සංවේදී සැලසුම් රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්ති සහ ප්‍රාදේශීය සංවර්ධන /මුල පිරීම්වල ඒකාබද්ධ කිරීම වැනි ක්‍රියාවලි මඟිනි. කම්පන සහ ආතතීන් හමුවේ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සඳහා අවධානම අඩු කිරීමේ උත්සාහයන් සහ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය වෙමින් ජාතික හා පළාත් මට්ටමින් රජයේ හදිසි සූදානම් සහ ප්‍රතිචාර හැකියාවන් ශක්තිමත් කිරීමද අපේක්ෂා කරයි.

මෙම ප්‍රතිඵලයේ අවධානය යොමු වන්නේ අවධානමට ලක්විය හැකි ප්‍රජාවන්ට කම්පන සහ ආතතීන්ට වඩා හොඳින් ඔරොත්තු දීමේ සහ ආපදා කළමණාකරණය සහ ඒකාබද්ධ ආපදා අවධානම අඩු කිරීමේ උපායමාර්ග ක්‍රියාවට නැංවීම සහ රජයේ ධාරිතාව ඉහළ නැංවීමයි.

මේ යටතේ නිමවුම් 03 කි. ප්‍රජාවන් දේශගුණික විපර්යාස ආන්තික කාලගුණය වෙනත් ව්‍යසනයන්ට අනුවර්තනය වීමට ඉඩ හැර කම්පන හා ආතතීන්ගේ බලපෑම අවම කිරීම , කම්පන හා ආතීන්ගෙන් නිතර බලපෑමට ලක්වන ප්‍රජාව හදිසි කළමණාකරණය සඳහා වන ජාතික ආයතනවල ධාරිතාව ශක්තිමත් කිරීමෙන් සහ මූලික ආහාර අවශ්‍යතා සපුරාලීමට හා කම්පන හමුවේ වඩාත් ඔරොත්තු දෙන ලෙසට පත්වීම, සහකම්පන හා ආතතීන් වලින් නිතර පීඩාවට පත්වන ප්‍රජාව ශක්තිමත් වූ කම්පන වලට ප්‍රතිචාර දක්වන ජාල පද්ධතිවලින් ප්‍රතිලාභ ලබා ඔවුන්ගේ ඔරොත්තු දීම වැඩි කිරීම.

අවධානමට ලක් විය හැකි ප්‍රජාවන් සහ ජීවනෝපාය විවිධාංගීකරණය කිරීම තුළින් ස්වභාවික කම්පන වලට එරොහිව ඔරොත්තු දීමේ හැකියව ගොඩනැගීම පිළිබඳ ව්‍යාපෘතිය මඟින් ජලය රැස් කිරීම හා ජලය ගබඩා කිරීම පිළිබඳව නිවාස ලාභීන් ශක්තිමත් කිරීම සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම කෘෂිකර්මය පිළිබඳ තරුණයන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම ආදිය ඉටු කරන ලදී. ඒ අනුව මඩකලපුව, මන්නාරම, මාතලේ, මොණරාගල සහ මුලතිව් දිස්ත්‍රික්ක 5ක කාලගුණික විපර්යාස හේතුවෙන් විපතට ජනතාවට සහන සැලසීම සඳහා ඉහත ක්‍රියාකාරකම් අරඹන ලදී.

### i. සුළු වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, සුළු වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2019 සිට 2022 දක්වා සුළුවාරිමාර්ග පද්ධති 76 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම විය. ඉන් සුළු වාරිමාර්ග පද්ධති 64 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි වාරිමාර්ග පද්ධති 12 2022 වසරේදී ප්‍රතිසංස්කරණය කර අවසන් කරන ලදී. ලෝක ආහාර වැඩසටහන කම්කරු ශ්‍රමය හා ඉදිකිරීම් සඳහා ආයෝජනය කරන ලදී. ගොවියෙකුට මාසයකට දින 20 ක් සඳහා ද දිනකට රු. 1400 ලෙස ද ගෙවන ලදී. මුලු මිනිස් ශ්‍රම දින ගණන 10481 ක් වූ අතර රු. මි. 14.67ක් ගොවි පවුල් 175 ක් අතර බෙදා දෙන ලදී. ලෝක ආහාර වැඩසටහන සුළු වාරිමාර්ග පද්ධති 12 හි ඉදිකිරීම් සඳහා රු. මි. 19.9 ක් ආයෝජනය කරන ලදී. මීට අමතරව ශ්‍රී ලංකා රජයද ඉදිකිරීම් කටයුතු සඳහා රු. මි. 31.6 ක් 2022 වසර තුළ ආයෝජනය කර ඇත. තවද ලෝක ආහාර වැඩසටහනේ ප්‍රතිපාදන රු. මි. 2.9 ක් වැයකර ඇත්තේ සුළු වාරිමාර්ග පුනරුත්ථාපන මෙහෙයුම් හා කළමනාකරණ පුහුණු හා ඉදිකිරීම් පුහුණු වැඩසටහන් 20 ක් පැවැත්වීම සඳහායි. මීට අමතරව ලෝක ආහාර වැඩසටහන සෘජුවම වාරි පද්ධති සඳහා ස්වයංක්‍රීය වර්ෂාපතන මාන 20 ක් සවිකර ඇති අතර එහි වටිනාකම රු. මි. 20.8 කි. තවද සපයා ඇති වාරි උපකරණ වල වටිනාකම රු. මි. 27.3 කි.

### ii. කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීමට සහායවීම

නියං සමයේදී කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය රැස්කර ගැනීමට හැකිවන පරිදි ගොවි පවුල් 605 ක් සඳහා කෘෂි ළිං 605 ක් අලුතින් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම ඉලක්කය විය.

මීට අමතරව ප්‍රතිලාභීන්ට අවශ්‍ය පුහුණු කිරීම්, බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ වෙළඳපල සබඳතා ලබා දෙන ලදී. 2022 දී කෘෂි ළිං පුනරුත්ථාපන ඉලක්කය කෘෂි ළිං 94 ක් වූ අතර කෘෂි ළිං 93 ක් නිම කරන ලදී. එක් නිවසක් සඳහා ආධාර මුදල රු. 275,000 ක් වූ අතර මුළු ආයෝජන මුදල 2022 දී රු. මි. 26.2 ක් විය. බොහෝ ගොවීන් ව්‍යාපෘති ප්‍රවාහයට අමතරව කෘෂි ළිං වල පරිමාව වැඩිකිරීමට සහ ළිං වළ පරිමාව වැඩිකිරීමට සහ ළිං වළ කල්පැවැත්ම වැඩිදියුණු කිරීමට අමතරව ආයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය.

**iii. ගොවිපල පොකුණු ඉදිකිරීම**

මාතලේ සහ මොණරාගල දිස්ත්‍රික්කවල වැසි ජලය සහ පිටාර ජලය එක රැස්කිරීම සඳහා ජාල පොකුණු 30 ක් ඉදිකරන ලදී. මෙම පොකුණු වල ජලය වියළි කාල වලදී ගොවිතැන් කටයුතු සඳහා යොදා ගනී. මීට අමතරව, සමහර ගොවීන් පොකුණු වල මිරිදිය මසුන් ඇති කරන ලදී. 2022 දී මුළු ආයෝජනය රු. මි. 4.63 කි.

**iv. ගොවීන් සඳහා පුහුණු වැඩසටහන්**

කෘෂි ළිං හා ජල පොකුණු ඉදිකිරීම වෙනුවෙන් ආධාර ලබන ප්‍රතිලාභී ගොවීන් සඳහා කාර්යක්ෂමව ජලය රැස්කිරීම හා භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන් 124 ක් පවත්වන ලදී. වියදම ලෙස රු. මි. 3.49 ක් වාර්තා වී ඇත.

**v. ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති සැපයීම**

දිස්ත්‍රික්ක 5 හි කෘෂි ළිං හා වැසිදිය පොකුණු ඉදිකිරීම සඳහා 2021 හා 2022 ආධාර ලබාගත් ගොවීන් සඳහා ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති 321 ක් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී. වාර්තා වූ වියදම රු. මි. 88.99 කි.

**vi .තරුණ කණ්ඩායම් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන්**

ව්‍යාපෘතියේ අරමුණ වුයේ තරුණ තරුණියන්ගේ අදායම ඉහෙළ නැංවීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීමයි. ආධුනිකයින්ට මෝටර් රථ , කෘෂි කාර්මික යන්ත්‍රෝපකරණ හා උපකරණ අළුත්වැඩියා කිරීම යන ක්ෂේත්‍රයන්ගේ පුහුණුවීම් ලබා දෙන ලදී. පාසල් හැරගිය 43 දෙනකුට 2021 දී පුහුණුව ලබා දීම අරඹා ඇති අතර 2022 දී ද පුහුණුව ලබා දී ඇත. පුහුණු කාලය සඳහා මාසික දීමනාවක් ලබා දී ඇත. පුහුණුව අවසානයේ අවශ්‍ය මෙවලම් කට්ටල ලබා දෙන ලදී. 2022 දී මුළු ආයෝජනය රුපියල් මිලියන 1.09 කී.

vii ජීවනෝපාය සංවර්ධන කටයුතු

සුළු පරිමාන ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට මෙම ව්‍යාපෘතිය උපකාරී වේ. එළු, කුකුල් හා ගව ගොවිපොලවල් පිහිටුවීමත්, වැව්වල මිරිදිය මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරිමත් හා ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳව පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

**අ. එළු ගොවිපොලවල් ක්‍රියාත්මක කිරීම**

එළු ගොවිපොලවල් 85 ක් ස්ථාපනය කිරීම ඉලක්ක වූ අතර එළු ගොවිපොල 74 ක් පිහිටුවන ලදී. එළු පාලනයේ නිරත ගොවීන් අතරින් ප්‍රතිලාභීන් තෝරාගෙන එළු නිවාසයන් ඉදිකිරීම සඳහා එක් ගොවියකුට රුපියල් 215,000 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. මුළු ආයෝජනය මිලියන 15.91 කී.

**ආ. කුකුළු ගොවිපල ක්‍රියාත්මක කිරීම**

කුකුළු ගොවිපොල 215 ක් පිහිටුවීම ඉලක්කය වූ අතර ස්ථාපිත ඒකක ප්‍රමාණය ද 215 ක් විය. තෝරාගත් ප්‍රතිලාභීන්ට පැටවුන් හා මාස 04 ක කාලයක් සඳහා කුකුළු අහාර ලබා දෙන ලදී. ව්‍යාපෘතිය මගින් සෘජුවම කුකුළු නිවාස ලබා දුන් අතර එක් ගොවියකුට පැටවුන් හා සත්ත්ව අහාර ලබා ගැනිම සඳහා රුපියල් 30,300 ක් ව්‍යාපෘතියෙන් ලබාදෙන ලදී. මුළු ආයෝජනය **රුපියල් මිලියන 6.28 කී.**

**ඇ. ගව ගොවිපල ක්‍රියාත්මක කිරීම**

ඉලක්ක ගත ගවගාල් පිහිටුවීම 57 ක් වූ අතර ස්ථාපිත ගවගාල් සංඛ්‍යාව 44 කී. ගවගාලක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභියෙකුහට රුපියල් 335,000 ක ප්‍රතිලාභයක් ලබාදෙන ලදී. මුළු ආයෝජනය රුපියල් මිලියන 18.34 කී. ඊට අමතරව එක් ප්‍රතිලාභී ගොවියකුට රුපියල් 5,000 බැගින් ලබා දෙන ලද්දේ ගවයන්ට අවශ්‍ය තෘණ වගාකර ගැනීම සඳහායි.තෘණ වගා භූමි 57 ක් ස්ථාපනය කරන ලද අතර මුළු ආයෝජනය රුපියල් මිලියන 0.29 කි.

**ඈ. මඩකලපුව දිස්ත්‍රික්කයේ මත්ස්‍ය ඇඟිලි පැටවුන් වර්ධන මධ්‍යස්ථානයක් ඇති කිරිම**

මඩකලපුව දිස්ත්‍රික්කයේ මත්ස්‍ය ඇඟිලි පැටවුන් ඇති දැඩි කරන වැටි 05 ක් ස්ථාපිත කරන ලදී. මුළු ආයෝජනය රුපියල් මිලියන 2.04 කි.

**ඉ. ජලාශ තුළ ඇඟිල්ලන් තැම්පත් කිරීම**

මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාද්ශීය ලේකම් කොට්ඨාශයේ ජලාශයක කුඩා මත්ස්‍ය පැටවුන් 50,000 ක් තැම්පත් කරන ලදි. වියදම රු. 210,000 ක් විය.

**ඊ. කෘෂි සැකසුම් සහ අගය එකතු කිරීමේ ව්‍යාපාර**

දිස්ත්‍රික් 03 ක තෝරාගත් පවුල් 21 ක් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපාර ඇති කිරීමට සහය දක්වා ඇත. මුළු ආයෝජනය රුපියල් මිලියන 5.78 කි.

**උ. ජීවනෝපාය ක්‍රියාකාරකම් සඳහා පුහුණු, දැනුවත් කිරීම සඳහා අධ්‍යයන චාරිකා**

වගාක්‍රම, අගය එකතු කිරීම්, අලෙවිකරණය ඇතුළු ජීවනෝපාය ක්‍රියාකාරකම් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 285 ක් පවත්වා ඇත. අධ්‍යයන චාරිකා වැඩසටහන් 03ක් පවත්වන ලදි. මුළු ආයේජනය රු.මිලියන 3.49 ක් විය.

**viii. දකුණ - දකුණු සහයෝගිතා වැඩ සටහන**

ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම සහ වැඩිදියුණු කළ අස්වනු සහ පසු අස්වනු කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරමින් ඵලදායිතාව ඉහළ නැංවීමට හා වෙළඳපල වෙත ප්‍රවේශ වීමට ගොවීන්ගේ සහ රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන් ශක්තිමත් කිරීමයි.

ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 100 ක් පවත්වන ලද අතර රජයේ නිලධාරින් සහ දේශීය ව්‍යාපාරිකයින් සඳහා අස්වනු නෙළීමේ සහ පසු අස්වනු තාක්ෂණයට අදාළ යන්ත්‍රෝපකරණ පිළිබඳ පුහුණු වැඩසටහන් 15 ක් පවත්වන ලදි.

මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඇළවෙළි ප්‍රතිසංස් කරණය කරන ලදි. අක්කර 500 ක බඩ ඉරිගු වගා කිරිම සඳහා ගොවි පවුල් 575 ක් වෙත මූල්‍ය ආධාර ලබා දෙන ලද්දේ වගාවන්ට අවශ්‍ය බඩ ඉරිගු බීජ, මූලික පොහොර හා කෘමිනාශක මිලදී ගැනීම සඳහායි.

ලෝක ආහාර වැඩ සටහන සෘජුවම අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික්ක වල පිහිටි ගොවි සංවිධාන වෙත පැළ සිටුවන යන්ත්‍ර 02ක් හා වල් මර්ධන යන්ත්‍ර 02 ක් ලබා දී ඇත. 2022 දී මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රුපියල් මිලියන 25.89 කි.

4. **2025 වන විට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 05 ට අඩු ළමුන්, නව යොවුන් වියේ ගැහැණු ළමයින් සහ ප්‍රජනන වයසේ කාන්තාවන්ගේ පෝෂණය වැඩිදියුණු කිරිම.**

කෘෂ වීම, ක්ෂුද්‍ර පෝෂණ ඌණතාවයන් හා අධිපෝෂණය වැඩිවීමේ ප්‍රවනතා වලට ප්‍රතිචාර ලෙස නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ වල නිශ්චිත ඉලක්ක කණ්ඩායම් සඳහා මෙන්ම සමස්ත ජනගහණය සඳහාද තාක්ෂණික සහය සහ සාක්ෂි මත පදනම් වූ උපදේශනය තුළින් පෝෂණ ප්‍රතිඵල වැඩි දියුණු කිරීම ඉලක්ක ගත කර ඇත. මෙය 2025 ලෝක සෞඛ්‍ය රැස්වීමක ඉලක්ක හා බද්ධ කර ඇත. ලෝක ආහාර වැඩසටහන විසින් තාක්ෂණික සහය සැපයීම, ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, විවිධ ක්‍රියාකාරකම් කිරීම , ඉලක්ක නිරීක්ෂණය කිරීම සහ රටවල් හා කලාප අතර දැනුම හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, පෞද්ගලික ආයතන, සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු රාජ්‍ය ආයතන නොවන අනෙකුත් පාර්ශව කරුවන් සමග කටයුතු කරයි.

මෙම ප්‍රතිඵලය, මන්දපෝෂණයේ ක්ෂණික හා ආවේණික හේතු ආමන්ත්‍රණය කරයි. මෙම ප්‍රතිඵලය පහත නිමැවුම් 02 මගින් ළඟා කර ගැනීමට අපේක්ෂිකයි. පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරිම සඳහා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජයේ හැකියාව ශක්තිමත් කිරීමෙන් අවුරුදු 05 ට අඩු දරුවන්, යොවුන් වියේ ගැහැණු ළමයින් සහ ප්‍රජනන වයසේ කාන්තාවන් ප්‍රතිලාභ ලබන්නන් බවට පත්වීම සහ වයස අවුරුදු 05 ට අඩු දරුවන්, නව යොවුන් වියේ ගැහැණු ළමයින් සහ ප්‍රජනන වයසේ සිටින කාන්තාවන් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා දේශීයව නිෂ්පාදනය කරන ලද ශක්තිමත් කරන ලද විශේෂයෙන් සකස් කරන ලද ආහාර වැඩි දියුණු කිරීමෙන් ලබන ප්‍රතිලාභ ලබා ගැනීම.

i. **ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ ඉරිගු සහ සෝයා මිලදී ගැනීම.**

ලෝක ආහාර වැඩසටහන සෘජුවම ත්‍රිපෝෂ නිෂ්පාදන සඳහා බඩ ඉරිගු හා සෝයා මිලදී ගන්නා ලදි. ඒ අනුව, බඩ ඉරිගු මෙට්‍රික් ටොන් 140.95 ක් හා සෝයා මෙට්‍රික් ටොන් 39.5 ක් දේශීයව මිලදී ගෙන ඇති අතර එම ප්‍රමාණය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ආයතනයට භාර දී ඇත. තොගයේ මුළු වටිනාකම රුපියල් මිලියන 51.623 කි.

**ii. අඩු ආදායම්ලාභී පවුල් සඳහා මූල්‍ය ආධාර ලබා දීම**

වයස අවුරුදු 05 ට අඩු දරුවන්, සිටින කළුතර දිස්ත්‍රික්කයේ ගැබිනි හා කිරිදෙන මව්වරුන් සඳහා ලෝක ආහාර වැඩසටහන මූල්‍ය ආධාර ලබා දී ඇත. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 637ක් වූ අතර මින් පවුලකට රුපියල් 10,000.00 ක් ලබා දෙන ලදි. මෙම මුදල එක් වරකදීම ලබා දුන් අතර මේ තුළින් ඔවුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය ආහාර මිලදී ගැනීමේ හැකියාව නැංවීම අපේක්ෂා කෙරිනි. ව්‍යාපෘතිය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලදි. ව්‍යාපෘතියට යෙදවූ මුදල රුපියල් මිලියන 6.37 කි.

**මූල්‍ය ප්‍රගතියේ සාරාංශය**

| අංකය | ප්‍රතිඵලය | වියදම (රු.මිලියන) | මුළු වියදමෙන් % |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල සහ සුළු පරිමාන ගොවීන්ගේ වසර පුරා ජීවනෝපාය | 318.32 | 4.57% |

| | | | |
|---|---|---|---|
| | සහ කම්පන වලට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම | | |
| 2 | අහාර අනාරක්ෂිත ප්‍රදේශවල සිටින පාසල් යන වයසේ දරුවන්ට වසර පුරා අහාර ලැබීම සඳහා ප්‍රවේශය | 14.27 | 0.20% |
| 3 | ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු දරුවන්ගේ නව යොවුන්වියේ ගැහැනු දරුවන්ගේ සහ සඵල වයසේ කාන්තාවන්ගේ පෝෂණය වන විට වැඩිදියුණු 2025 කිරීම | 57.99 | 0.83% |
| 4 | ශ්‍රී ලංකාවේ කාලගුණික හා වෙනත් අර්බුද වලින් පීඩාවට පත්වන ජනතාව වෙත වසර පුරා අහාර ලැබීම සඳහා ප්‍රවේශය | 6,563.31 | 94.25% |
| 5 | පරිපාලන වියදම් | 9.87 | 0.14% |
| | **එකතුව** | **6,963.77** | **100.00%** |

ඉහත වගුවට අනුව, ව්‍යාපෘති වියදම් වලින් 94% කට වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ කාළගුණික හා වෙනත් අර්බුද වලින් පීඩාවට පත්වන ජනතාව වෙත ආහාර ලැබීම සඳහා ප්‍රවේශය හා ප්‍රතිඵලය ලබා ගැනීම සඳහායි.

**මූල්‍ය ප්‍රගතිය – 2022**

| Vote | අයවැය ප්‍රතිපාදන (රු. මිලියන) | සංශෝධිත වෙන් කිරීම (රු. මිලියන) | මුදාහරින ලද වෙන් කිරීම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | % |
|---|---|---|---|---|---|
| 13 (WFP අරමුදල ) | 450.0 | 7,059.35 | 6,845.58 | 6,819.09 | 99.61% |
| 17 (GOSL අරමුදල) | 50.0 | 177.10 | 156.06 | 144.68 | 92.71% |
| **Total** | **500.0** | **7236.45** | **7,001.64** | **6,963.77** | **99.46%** |

## 2.11

පහත සඳහන් ව්‍යාපෘති 2022 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කර ඇති අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා කළමනාකරණය සඳහා සමස්ත මාර්ගෝපදේශනය සහ සහාය ලබා දී ඇත.

### 1.ලෝක බැංකු අරමුදල් සහිත ආයෝජන ව්‍යාපෘතියේ කොවිඩ් - 19 සඳහා වන අවිනිශ්චිත හා හදිසි ප්‍රතිචාර සංරචක(CERCs)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ සෞඛ්‍ය, සමාජ ආරක්ෂණය, කෘෂිකර්මය, අධ්‍යාපනය, ප්‍රවාහන අංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය හරහා රාජ්‍ය සේවා දුරස්ථව සැපයීම ආදී අංශ ආවරණය වන පරිදි කෙටි සහ මධ්‍ය කාලීන ප්‍රතිචාර සහ ප්‍රතිසාධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමයි.

මෙයට අනුකූලව, පහත ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දී ඇත:

i. කෘෂිකර්මය - ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය

ii. සාමාන්‍ය අධ්‍යාපනය - ටෙලි අධ්‍යාපනය සහ විද්‍යුත් ඉගෙනීම, පාසල් ආහාර වැඩසටහන, අවශ්‍යතා ඇති පාසල් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම
iii. අත්‍යවශ්‍ය පොදු ප්‍රවාහන සේවා සනීපාරක්ෂිත ආකාරයෙන් සැපයීම
iv. කොවිඩ් - 19 අතරතුර ගංවතුර ප්‍රතිචාරයක් ලෙස අවතැන් වූ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආපදා මධ්‍යස්ථාන වෙත අත්‍යාවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය සැපයීම, සහ
v. රාජ්‍ය අංශයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය
ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො මිලියන 56 (ආසන්න වශයෙන්. රු. මිලියන 14,876) වන අතර සංශෝධිත ව්‍යාපෘති කාලසීමාව 2020 මැයි සිට 2023 මාර්තු 31 දක්වා වේ.

2022 දෙසැම්බර් අවසානය වන විට, සමුච්චිත වියදම රු. මිලියන 10,098.28 ක් ලෙස වාර්තා වූ අතර සමුච්චිත භෞතික ප්‍රගතිය (ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස) දළ වශයෙන් සියයට 95 කි.

**2.** වත්මන් ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලෝක බැංකු සමූහයේ මූල්‍ය පහසුකම් යටතේ ඇති ආයෝජන ව්‍යාපෘතිවල හදිසි ප්‍රතිචාර සංරචක (ICDP CERC)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වන්නේ සමාජ ස්ථාවරත්වය ප්‍රතිස්ථාපනය කරමින් රටේ දිළිඳු හා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට වත්මන් ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා කෙටිකාලීන හා මධ්‍ය කාලීන මැදිහත්වීමක් ලබා දීමයි.

ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්:

කෘෂිකර්මය (යූරියා පොහොර ප්‍රසම්පාදනය), සමාජ ආරක්ෂණය (මූල්‍ය සහනාධාර) සහ බලශක්තිය (පිසින ගෑස් සැපයීම) යන අංශ ආවරණය වන පරිදි කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීම් සමඟ ප්‍රතිචාර සහ ප්‍රතිසාධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
මෙයට සමගාමීව, අදාළ ක්‍රියාත්මක කරන ආයතන විසින් පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

i. 2022/23 මහ කන්නය සඳහා යූරියා පොහොර ප්‍රසම්පාදනය
ii. සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත සහ නිදන්ගත වකුගඩු ආබාධිත ප්‍රතිලාභීන් සඳහා මූල්‍ය සහනාධාර ලබා දීම.
iii. ලිට්‍රෝ ගෑස් ප්‍රසම්පාදනය

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො මිලියන 325 (ආසන්න වශයෙන් රු. මිලියන 108,062) වන අතර ව්‍යාපෘති කාලසීමාව 2022 මැයි 9 සිට 2023 නොවැම්බර් 9 දක්වා වේ.

2022 දෙසැම්බර් අවසානය වන විට, සමුච්චිත වියදම රු. මිලියන 99,323 ක් ලෙස වාර්තා වූ අතර සමුච්චිත භෞතික ප්‍රගතිය (ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස) දළ වශයෙන් සියයට 96 කි.

දෙපාර්තමේන්තුවේ දැනට පවතින තොරතුරු පද්ධතිය/ඩිජිටල් ක්‍රමය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, යහපත් කෘෂි පිළිවෙත් (GAP) මෙන්ම GAP සහතික කිරීමේ පුහුණුව ලබා දීම ආදිය මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතවේ. අවදානමට ලක්විය හැකි කාන්තාවන්ගේ සහ ළමුන් ඇතුළු පවුල්වල ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම, කාන්තා නවාතැන් සහ ළමා නිවාසවල සිටින අය සහ ආයතනික රැකවරණයේ තැබීමේ අවදානමට ලක්ව සිටින ළමුන් සහ තරුණයින් ඇතුළුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සහ ගෘහස්ථ හිංසනයට ගොදුරු වූවන් සඳහා සහාය යාන්ත්‍රණ සහ සේවාවන් ශක්තිමත් කිරීම ද මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට අපේක්ෂිත වේ.

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො මිලියන 203 (ආසන්න වශයෙන් රු. මිලියන 73,080) වන අතර ව්‍යාපෘති කාලසීමාව 2022 සැප්තැම්බර් 9 සිට 2024 අගෝස්තු 31 දක්වා වේ.

2022 දෙසැම්බර් මස අවසන් වන විට සමුච්චිත වියදම රු. මිලියන 49,946.4 ක් ලෙස වාර්තා වූ අතර සමුච්චිත භෞතික ප්‍රගතිය (ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස) දළ වශයෙන් සියයට 56කි.



.......................................................................

ප්‍ර.ග.නි/ ග.නි/ආයතන ප්‍රධානී අත්සන

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

**03 පරිච්ඡේදය- 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත**

**3.1 මූල්‍ය කාර්ය සාධනය**

**03 පරිච්ඡේදය- 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත**

**3.1 මූල්‍ය කාර්ය සාධනය**

ඒසීඒ-එෆ්

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 | | සටහන | තථ්‍ය 2022 | නැවත ගලපන ලද 2021 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 304,415,300 | 210,094,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 157,382 | 73,835 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 8,352,736 | 11,375,698 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **312,925,418** | **221,543,533** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **312,925,418** | **221,543,533** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 128,177,563 | 1,402,031 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **184,747,856** | **220,141,502** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 118,880,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 108,337,954 | 105,035,578 | ඒසීඒ-2(ii) |
| 36,490,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 33,416,395 | 33,727,356 | |
| 179,602,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 108,958,100,969 | 1,278,122 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **179,757,670,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **109,099,855,318** | **140,041,055** | |
| | **මූලධන වියදම්** | | | | |
| 1,100,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 864,637 | 6,859,480 | ඒසීඒ-2(ii) |
| 6,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 5,753,519 | 7,182,999 | |
| 500,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 6,963,769,597 | 586,114,559 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 41,465,777,225 | - | |
| 650,000 | හැකියා වර්ධනය | 14 | 173,000 | 61,000 | |
| 9,088,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 8,079,370,749 | 10,011,290,662 | |
| **9,596,750,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **56,515,708,727** | **10,611,508,701** | |
| | තැන්පතු ගෙවීම් | | 157,382 | 81,285 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,760,643 | 15,032,558 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **5,918,025** | **15,113,843** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **165,621,482,071** | **10,766,663,600** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (165,436,734,215) | (10,546,522,098) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (165,436,734,215) | (10,546,522,098) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 127,859,188 | 121,445,431 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 15,106,922 | 17,699,015 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 1,402,031 |
| මුළු වත්කම් | | **142,966,110** | **140,546,477** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 15,106,922 | 17,699,015 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 127,859,188 | 121,445,431 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 1,402,031 |
| මුළු වගකීම් | | **142,966,110** | **140,546,477** |

පිටු අංක 7 සිට 31 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 40 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන | නම : ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි | නම : ඩබ්.එස්.පී. ද මෙල් |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2023.02. 28 | දිනය : 2023.02. 27 | දිනය : 2023.02. |

කේ.එම්.එම්. සිරිවර්ධන
භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරී
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

2

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජ්සීජ්-සී

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතාය | නැවත ගලපන ලද |
|---|---|---|
| | **2022** | **2021** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 9,943,825,651 | 883,060,702 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 5,965,003 | 6,530,794 |
| අග්‍රිම ලැබීම් | 304,415,300 | 210,094,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 5,638,363 | 15,228,347 |
| තැන්පතු ලැබීම් | 157,382 | 73,835 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **10,260,001,699** | **1,114,987,678** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 10,120,132,927 | 1,097,173,757 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,308,933 | 1,278,122 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 185,745 | 233,332 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 128,177,563 | 1,402,031 |
| අත්තිකාරම් ගෙවීම් | 4,285,631 | 14,819,151 |
| තැන්පතු ගෙවීම් | 157,382 | 81,285 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **10,254,248,180** | **1,114,987,678** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **5,753,519** | - |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 5,753,519 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **5,753,519** | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(5,753,519)** | - |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | (0) | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

3

**මූල්‍ය ප්‍රකාශ සටහන් - -**

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 179,757,670,000 | 132,855,574,704 | 109,099,855,318 | 82.12 |
| ප්‍රාග්ධන | 9,596,750,000 | 57,063,945,296 | 56,515,708,727 | 99.04 |
| මුළු එකතුව | **189,354,420,000** | **189,919,520,000** | **165,615,564,045** | **87.20** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 33,810,000.00 | | 100 |
| 9152 | වාහන | | 52,395,763,00 | | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ හා අනෙකුත් | | 41,653,424.86 | | 100 |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම I ලෙස දක්වා ඇත.

## 04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | 100 | | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 99.45 % | | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 100% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | | 80% | |

## 05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අංශ 9කට සහ උප අංශ 26කට වෙන් කර ඇත.එක් එක් අංශය ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශවලට යටත්ව සිදු කෙරේ. ඒ අනුව, අදාළ අමාත්‍යාංශ මගින් මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා රු.මිලියන 10ට වැඩි සියළුම ව්‍යාපෘති වාර්තා අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ සඳහන් වන 11 වන කාණ්ඩය අනුව යෝජිත ව්‍යාපෘති මඟින් තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව, දර්ශක 244 කින්, ඉලක්ක 169 කින සහ අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.

තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි.එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු

නොලැබේ.ඒ අනුව, රාජ්‍ය ආයෝජන සැලැස්ම , සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන සභාව සමඟ සහයෝගීත්වයෙන් සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණ යෙන් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය නායකත්වය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් ලබාදේ.

2022 වර්ෂයේ ස්වේච්ඡා ජාතික ඇඟයීම සඳහා ශ්‍රී ලංකාව තෝරාගෙන ඇති බැවින්, තිරසාර සංවර්ධන සභාව සමඟ එක්ව ඒ සඳහා අවශ්‍ය කාර්යයන් 2021 වර්ෂය තුලදී හා 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, ස්වේච්ඡා ජාතික ඇඟයීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා මහාභාණ්ඩාගාරයේ ලේකම්තුමාගෙන් අනුමැතිය අනුව මෙහෙයුම් කමිටුවක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ තිරසාර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද අතර මෙම කමිටු සාකච්ඡා කිහිපයක් පවත්වන ලදි. ඊට අමතරව තිරසාර සංවර්ධන සභාව සංවිධානය කරන ලද ජාතික සහ පළාත් වැඩමුළුවලට සහභාගි වී අවශ්‍ය මඟපෙන්වීම් ලබා දී ඇත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය සමඟ 2023 -2027 කාලපරිච්ඡේදය සඳහා අත්සන් කිරීමට නියමිත තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව සකස් කිරීමේ දී සහ ලෝක ආහාර වැඩසටහන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල , එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල,එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මෙන්ම අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන් සමඟ එක්ව දේශිය වැඩසටහන් ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී ද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක පිළිබඳව විශේෂයෙන් සලකා බලනු ලබයි.

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 70 | 44 | 26 |
| තෘතීයික | 02 | 01 | 01 |
| ද්විතියික | 56 | 36 | 20 |
| ප්‍රාථමික | 42 | 31 | 11 |

**06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට අංශ කිහිපයක රාජකාරි ආවරණය කිරීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට කාර්යාල වේලාවෙන් බැහැරවත් රාජකාරි ඉටුකිරීමට සිදුවෙයි.

**06.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | වසර 01 | 150,000.00 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| වැටුප් පරිවර්ථනය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 02 දිනක් | වෙනත් ආයතනයක් මගින් පවත්වා ඇත.ගාස්තු අයකර නැත | | දේශීය | වැටුප් පරිවර්ථනය පිළිබඳ නිපුනතාවය ලැබීම |
| ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන | 18 | 17 දිනක් | ගාස්තු අයකර නැත | | දේශිය | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව කාර්යක්ෂමව නිවැරදිව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම |
| වැටුප් පරිවර්ථනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 02 දිනක් | 7,000.00 | | දේශීය | වැටුප් පරිවර්ථන සම්බන්ධව කාර්යක්ෂමව නිවැරදිව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තොරතුරු පද්ධති සංවර්ධනය පිළිබඳ පුහුණුව | 03 | 01 දිනක් | | | දේශීය | තොරතුරු පද්ධති සංවර්ධනය පිළිබඳ හැකියාව වර්ධනය වීම |
| තොරතුරු තාක්ෂණ විගණන පුහුණුව | 01 | දින 01 | | | දේශීය | තොරතුරු පද්ධති විගණනනය පිළිබඳ දැනුම වර්ධනය වීම |
| දෙමළ භාෂා ප්‍රවීනතාවය සඳහා පුහුණු වැඩසටහන | 12 | පැය 150 | - | | දේශීය | දෙමළ භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුනතාවය ලබා ගැනීම |
| දෙමළ භාෂා ප්‍රවීනතාවය සඳහා පුහුණු වැඩසටහන | 08 | පැය 100 | - | | දේශීය | දෙමළ භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුනතාවය ලබා ගැනීම |
| " Strengthing Resilience of Vulnerable communities in Sri Lanka and India for Impact of Climate Change" තාක්ෂණික වැඩමුළුවට | 01 | දින 02 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regional Cooperation & Integration – Strengthening regional Cooperation for a new Era of Collective action සම්මන්ත්‍රණය | 01 | දින 04 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Launch of ADB's Gender equality & Social Inclusion Framework in | 01 | දින 04 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| South Asia උප ප්‍රාදේශිය සම්මන්ත්‍රණය | | | | | | දැනුම දායක කර ගැනීම |
| Using NTA Exidance for population and development policy advancement in Asia –Pacific සමුළුව | 02 | දින 04 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Asia and the Pacific Health Financing Forum සමුළුව | 01 | දින 02 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Enaergy Storage Forum සමුළුව | 01 | දින 04 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Leveraging and Managing Climate Finance for Sustainable Development සමුළුව | 01 | දින 03 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regional Exchange in protecting social sector spending in times of shocks under the EU-UNICEF building finance facilities for South Asia and Southeast Asia regional meeting | 01 | දින 01 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| South –South Exchange : Integtrating Gender Equality and Social Inclusion in Climate budgeting | 01 | දින 02 | | විදේශීය | | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| and planning processes and innovative clime finance in the Asia-Pacific region | | | | | | |

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | **අනුකූල වේ** | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | **අනුකූල වේ** | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | **අනුකූල වේ** | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන | **අදාල නොවේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | සැලැස්ම සකස් කිරීම | | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අදාල නොවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | **අනුකූල වේ** | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | **අදාල නොවේ** | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | **අනුකූල වේ** | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | **අදාල නොවේ** | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | **අනුකූල වේ** | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල වේ** | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | **අනුකූල වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |

**අවසානය.**

ඇමුණුම - 01

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | TPD/B/NPD/02/22/39 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි 30 දින |

ගණන්දීමේ නිලධාරී

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයන් 03 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන්කරන ලද එකතුව රු.275,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීමට වැය විෂයන් 12 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන්කරන ලද එකතුව රු.11,858,397 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වූ රු.8,231,089 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 54 සිට සියයට 99 ක පරාසයක් වී තිබුණි.

(ඇ) අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කර නොගෙන වැය විෂයන් 04 ක් වෙනුවෙන් මු.රෙ 66 ප්‍රකාරව එකතුව රු.43,864,155,744 ක් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

(ඈ) අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණු වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.8,323,095,612 ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් හා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම අමතර ප්‍රතිපාදන ලබා ගත් පසුව වැය විෂයයන් 05 ක ඉතිරි වූ ප්‍රමාණය එකතුව රු.272,785,724 ක් විය.

### 2.2 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කල යුතු බව දක්වා තිබුණි. ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකරගැනීම් රු.7,354,843 ක් ද, අත්තිකාරම් ගෙවීම් රු.6,002,111 ක් ද වී තිබුණි. නමුත් ඒවා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් රු.5,638,363 ක් හා රු.4,285,631 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් සඳහා මුදල් ගලාඒම් සහ ගලායාම රු. 1,716,480 ක් අඩුවෙන් දක්වා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, චක්‍රලේඛයේ 3 (අ) ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි.

3.1.2 කාර්යභාර ඉටු කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියලුම රජයේ දෙපාර්තමේන්තු සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, ලෝක ආහාර වැඩසටහන (World Food Program) යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන විදේශ ව්‍යාපෘති 02 ක වැය විෂයයන් 02 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන් කරන ලද එකතුව රු.634,104,060 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාජ ස්ථාවරත්වය පිහිටුවීම ව්‍යාපෘතියේ වැය විෂයය අංක 237-1-1-19-1501-23/12 විදේශ ණය යටතේ මූල්‍යකරණ කර ඇති ශුද්ධ ප්‍රතිපාදනය රු.20,630,000,000 කින් රු.8,065,654,415 ක් පමණක් වැය කර රු.12,564,345,584 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 61 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. මෙම ඉතිරියට හේතුව ලෙස ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ යූරියා සඳහා ප්‍රසම්පාදනය ප්‍රමාද වීම බව දක්වා තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සමාජ ස්ථාවරත්වය පිහිටුවීම හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත්වූ පවුල් වෙත සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වූ විදේශ ණය යටතේ මූල්‍යකරණ කර ඇති ව්‍යාපෘති වෙනුවෙන් වෙන්කරන ලද එකතුව රු.98,919,000,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.71,654,995,940 ක් ප්‍රතිපාදන වෙන් කරන ලද වැය විෂයයන් 06 ක් සඳහා භාවිතයට නොගෙන වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එම ප්‍රමාණය ව්‍යාපෘති වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 100ක පරාසයක පැවතුණි.

(ඈ) ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත් වූ පවුල් වෙත සහන සැලසීම ව්‍යාපෘතියේ වැය විෂයයන් 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මු.රෙ. 66 මගින් එකතුව රු.26,998,677,900 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම අමතර ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසුව එම වැය විෂයයන්හි ඉතිරියේ එකතුව රු.1,224,281,422 ක් වී තිබුණි.

## 3.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස 16 වන දින දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකු වෙත ලබාදී තිබූ ලැප්ටොප් පරිගණකය විගණිත දිනය වූ 2023 මැයි 10 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණු බව සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

## 4. තිරසර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවිය.

## 5. මානව සම්පත් කළමනාකරණය

## 5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් විය. ඒ අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් වර්ෂ කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 10 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට